

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

කාර්ය සාධන වාර්තාව
2022

තැ. පෙ. අංක 533 - 341, ඇල්විටිගල මාවත, කොළඹ 05.

පටුන

පිටු අංකය

1. පරිච්ඡේදය

1.1	දෙපාර්තමේන්තු පසුබිම	1
1.2	දෙපාර්තමේන්තුවේ දැක්ම / මෙහෙවර / අරමුණු	2
1.3	දෙපාර්තමේන්තුවේ කාර්යභාරය	2
1.4	සංවිධාන ව්‍යුහය / කාර්ය මණ්ඩලය	3 - 4
1.5	දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු	5 - 10

2. පරිච්ඡේදය

2.1	ධාවනය කළ හැකි මෝටර් වාහන නව ලියාපදිංචිය	11 - 18
2.2	වාහන හිමිකම් පැවරීම ලියාපදිංචි කිරීම	19 - 20
2.3	රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ සේවාව	21 - 22
2.4	මෝටර් වාහන සම්බන්ධ කාර්මික සේවාව	22 - 23
2.5	වායු විමෝචන තත්ත්වය නියාමනය	24 - 27
2.6	මාර්ග ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය	27 - 28

3. පරිච්ඡේදය

3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	29 - 30
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	31
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	32 -33
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	34
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	34
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	35
3.7	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය ලද ප්‍රතිපාදන	35
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	36
3.9	විගණකාධිපතිගේ වාර්තාව	36

4. පරිච්ඡේදය

4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක	37

5. පරිච්ඡේදය

5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	38 - 40
5.2	තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	41

6. පරිච්ඡේදය

6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	42
6.2	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ඇත්තේ කෙසේද	42
6.3	මානව සම්පත් සංවර්ධනය	43

7. පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව 44 - 51

ඇමුණුම 01 - විගණකාධිපති වාර්තාව

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ පණිවුඩය

මෝටර් වාහන ලියාපදිංචිය හා රියදුරු බලපත්‍ර නිකුත් කිරීම අරමුණු කර ගනිමින් 1928 වර්ෂයේදී ආරම්භ කරන ලද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මේ වන විට අවුරුදු 97 ක දීර්ඝ ගමනක් පැමිණ තිබේ. ඒ යටතේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය මැන බැලීම සඳහා සකස් කෙරෙන කාර්ය සාධන වාර්තාව මෙවර නිකුත් කෙරෙනු ලබන්නේ 93 වන වරට වීම සතුටට කරුණකි. මෝටර් රථ වාහන නව ලියාපදිංචි කිරීම, හිමිකම් පැවරීම ලියාපදිංචිය, රියදුරු බලපත්‍ර නිකුත් කිරීම, මෝටර් වාහන සම්බන්ධ කාර්මික සේවාව, මාර්ග ආරක්ෂාව හා වායු විමෝචන තත්ත්ව නියාමනය කිරීම යනාදිය මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන් වේ.

2022 වර්ෂයේ ප්‍රගතිය සලකා බැලීමේදී, නව ලියාපදිංචි මෝටර් වාහන සංඛ්‍යාව 20,510 ක් විය. මෙම වසරේ දී සිදු කරන ලද වාහන පැවරුම් සංඛ්‍යාව 612,877 ක් වන අතර, වසර අවසානය වන විට ශ්‍රී ලංකාවේ සම්පූර්ණ මෝටර් රථ ගහණය 8,352,212 ක් වේ.

එමෙන්ම, 2022 වසර තුළ නිකුත් කරන ලද රියදුරු බලපත් ප්‍රමාණය 876,684 ක් වේ. තවද, අමප/20/0691/225/024 අංක සහ 2020.04.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ කාර්යය 2021.01.01 දින සිට ශ්‍රී ලංකා යුධ හමුදාවට පැවරීම රියදුරු බලපත් නිකුත් කිරීම සම්බන්ධව වර්ෂයේ දී ගනු ලැබූ වැදගත් තීරණයක් වේ.

A ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙසින් අප දෙපාර්තමේන්තුව, 2022 වර්ෂයේ රු.මි.7,928.2 ක ආදායමක් උපයා ඇති අතර, එම වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වියදම රු. මි.1,329.3 කි.

මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව ඉටු කිරීමේ දී, මෝටර් රථ නියාමනයෙහි සිදු කරන ලද අවශ්‍ය මඟ පෙන්වීම් වෙනුවෙන් ප්‍රවාහන අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමන්ට හා ගරු රාජ්‍ය අමාත්‍යතුමන්ටත්, ඒ සඳහා යටිතල පහසුකම් හා උපදෙස් ලබා දෙමින් සහයෝගය ලබා දුන් අමාත්‍යාංශ ලේකම්තුමන්ලාටත් මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි. එසේම දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටු කිරීමෙහිලා අවශ්‍ය සහයෝගය ලබා දුන් දෙපාර්තමේන්තුවට සම්බන්ධ සියලු ආයතන වලටත්, දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීමෙහිලා කැපවීමෙන් යුතුව කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දුන් දෙපාර්තමේන්තුවේ සියලු කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පුද කරමි.

දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගනිමින් ප්‍රමිතිගතව සහ තාක්ෂණිකව මෙහෙයවන ක්‍රියාවලියකින් මෝටර් වාහන නියාමනය හා පාලනය කරන ප්‍රතිචාරාත්මක සංවිධානයක් තුළින් විශිෂ්ඨත්වය කරා යන රාජ්‍ය සේවයේ විශ්වාසනීයම සේවා සපයන්නා බවට පත් වීම සඳහා කටයුතු කිරීම අප දෙපාර්තමේන්තුවේ ඉදිරි බලාපොරොත්තුවයි.

නිශාන්ත අනුරුද්ධ වීරසිංහ
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්

1 පරිච්ඡේදය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

1.1 දෙපාර්තමේන්තු පසුබිම

ශ්‍රී ලංකාව තුළ වාහන ලියාපදිංචි කිරීම හා රියදුරු බලපත් නිකුත් කිරීම අරමුණු කර ගනිමින් 1916 අංක 14 දරන පනත සම්මත කර ඇති අතර, පොලිස්පතිවරයා විසින් එම කාර්යයන් ආරම්භ කර ඇත. පසුව, 1927 අංක 20 දරන මෝටර් කාර් ආඥා පනත නීති ගත කර ඇති අතර, මෝටර් රථ රෙජිස්ට්‍රාර්වරයකු යටතේ මෝටර් රථ රෙජිස්ට්‍රාර් කාර්යාලය ආරම්භ කර ඇත. එමෙන්ම 1938 අංක 45 දරන මෝටර් රථ ආඥාපනත මඟින් තව දුරටත් වැඩි දියුණු කරන ලදී. ඉන් අනතුරුව, වර්ෂ 1951 අංක 14 දරන මෝටර් වාහන පනත මගින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ස්ථාපනය කර ඇති අතර එමඟින් ශ්‍රී ලංකාව තුළ ධාවනය කළ හැකි මෝටර් වාහන නව ලියාපදිංචිය, වාහන හිමිකම් පැවරීම ලියා පදිංචිය, රියදුරු බලපත් නිකුත් කිරීම, මෝටර් වාහන සම්බන්ධ කාර්මික සේවාවන් සැපයීම, වායු විමෝචන තත්ත්වය නියාමනය සහ මාර්ග ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය ප්‍රධාන කාර්යයන් ලෙස ඉටු කරනු ලැබේ.

වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ වාහන භාවිතයේ සීඝ්‍ර වැඩිවීමත් සමඟම පුළුල් වී ඇති දෙපාර්තමේන්තු කාර්යන් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉටු කිරීම සඳහා නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින්, වේරහැර කාර්යාලය හා සෑම දිස්ත්‍රික් කාර්යාලයක් හරහාම දෙපාර්තමේන්තුමය සේවාවන් සැලසීම සිදු කරනු ලබයි. මේ අනුව වර්තමානය වන විට දිස්ත්‍රික් කාර්යාල කිහිපයක් මාර්ගගත (online) සම්බන්ධතාව මත ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව සමත් වී ඇත.

සියලුම දිස්ත්‍රික් කාර්යාල මාර්ගගත (online) සම්බන්ධතාව මගින් නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය සමඟ සම්බන්ධවීමෙන්, ග්‍රාමීය / ප්‍රාදේශීය මට්ටමේ සේවාලාභීන්ගේ අපේක්ෂාවන් / අවශ්‍යතා කඩිනමින් ඉටුකිරීමත්, නවීන පහසුකම් සහ නව තාක්ෂණය තුළින් සේවාලාභි අපේක්ෂාවන් වඩා පහසු කරලීමත් දෙපාර්තමේන්තුවේ ඉදිරි අභිලාෂයන් අතර ප්‍රධාන වේ.

1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම

"ප්‍රමිතිගතව සහ තාක්ෂණිකව මෙහෙයවන ක්‍රියාවලියකින් මෝටර් රථ නියාමනය හා පාලනය කරන ප්‍රතිචාරාත්මක සංවිධානයක් තුළින් විශිෂ්ඨත්වය"

දෙපාර්තමේන්තුවේ මෙහෙවර

"සාමූහික ප්‍රයත්නය හා නව තාක්ෂණය කාර්යක්ෂමව යොදා ගනිමින් මෝටර් වාහන පනත හා අනෙකුත් නීති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රතිචාරාත්මක සංවිධානයක් නිර්මාණය කිරීම."

දෙපාර්තමේන්තුවේ අරමුණු

- ✓ ඵලදායී හා කාර්යක්ෂම තාක්ෂණයන්ගෙන් දෙපාර්තමේන්තුව සන්නද්ධ කිරීම
- ✓ වැඩිදියුණු කරන ලද යටිතල පහසුකම් තුළින් උසස් පාරිභෝගික සේවාවක් ලබාදීම
- ✓ ඵලදායී හා කාර්යක්ෂම කාර්යාල කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම
- ✓ සේවා ක්‍රියාවලි වැඩිදියුණු කිරීමට අදාළ රෙගුලාසි ක්‍රමවත්ව ක්‍රියාත්මක වීම තහවුරු කිරීම

1.3. දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

1. ධාවනය කළ හැකි මෝටර් වාහන නව ලියාපදිංචිය
2. වාහන හිමිකම් පැවරීම ලියාපදිංචිය
3. රියදුරු බලපත්‍ර නිකුත් කිරීම
4. මෝටර් වාහන සම්බන්ධ කාර්මික සේවාවන් සැපයීම
5. වායු විමෝචන තත්ත්වය නියාමනය
6. මාර්ග ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය

1.4 සංවිධාන ව්‍යුහය


DEPARTMENT OF MOTOR TRAFFIC
ORGANIZATIONAL STRUCTURE
COMMISSIONER GENERAL OF MOTOR TRAFFIC
GA/DS
CFO
CA
C/IA
PD (E)
Commissioner (Investigation I)
Commissioner (IT)
Commissioner (Development)
Commissioner (D/E)
Commissioner (Administration)
ACC
ACC
S/O
S/O
S.K
S/O
S/O
S/O
STA
STA
STA
STA
STA
STA
A/D (IT)
DC/AC (IT)
P.R.G.M
A/O (D.E)
A/O
C/EMV
S/EMV
DC/AC
DC/AC (Technical
S/EMV
EMV/SO
EMV
EMV
AC /DC (District)
DC/AC
DC/AC
DC/AC
DC/AC
DC/AC
DC/AC
DC/AC (Admin)
A/O (Admin)
Legal Officer
S.T.O
S/O
S/O
S/O
S/O
S/O
S/O
S/O
STA
STA
STA
STA
STA
STA

කාර්ය මණ්ඩලය

මාණ්ඩලික නිලධාරී කාර්ය මණ්ඩලය - 2022

- කොමසාරිස් ජනරාල් - නිශාන්ත අනුරුද්ධ වීරසිංහ මයා
- ප්‍රධාන මූල්‍ය නිලධාරී - ඩී.වී.ඩබ්ලිව්.බෙත්මගේ මිය
- කොමසාරිස් (පාලන) - පී.සුසන්ත ජයතිලක මයා
- කොමසාරිස් (රියදුරු බලපත්) - එන්.ඩබ්. ආරියරත්න මයා
- කොමසාරිස් (සංවර්ධන) - ඩී.කුසලානි ද සිල්වා මිය
- කොමසාරිස් (විමර්ශන) - ඩබ්.එස්. සේනාතිස්ස මයා
- කොමසාරිස් (තොරතුරු තාක්ෂණ) - වයි.කේ.එස්.ජීවමාලා මිය
- ප්‍රධාන ගණකාධිකාරී - යූ.ඩී.එන්.එස්. සිරිවර්ධන මිය
- ප්‍රධාන අභ්‍යන්තර විගණක - ජේ.ආර්. රන්දෙනිය මයා
- නියෝජ්‍ය කොමසාරිස් (යතුරු පැදි පැවරුම්) - පී.කේ. සංජීවනී මිය
- නියෝජ්‍ය කොමසාරිස් (කාර් පැවරුම්) - එල්.ජී.පී. ප්‍රසාද් මයා
- නියෝජ්‍ය කොමසාරිස් (වෙළඳ වාහන න.ලි.ප.) - සුබෝධා එස්.කේ. එල්ලාවල මිය
- නියෝජ්‍ය කොමසාරිස් (වෙළඳ වාහන පැවරුම්) - බී.ඒ.එම්. බාලසූරිය මිය
- නියෝජ්‍ය කොමසාරිස් (ගම්පහ) - වයි.ඒ.එම්. යාපා මිය
- නියෝජ්‍ය කොමසාරිස් (රියදුරු බලපත්) - සී.ආර්.එල්. ගුණවර්ධන මයා
- නියෝජ්‍ය කොමසාරිස් (ත්‍රීවිල් පැවරුම්) - කේ.කේ.කේ. ෆොන්සේකා මිය
- නියෝජ්‍ය කොමසාරිස් (කුරුණෑගල) - පී.බී.සී.කේ. බණ්ඩාර මයා
- සහකාර කොමසාරිස් (අනුරාධපුර) - පී.වී.සී. පනාවල මයා
- නියෝජ්‍ය කොමසාරිස් (හම්බන්තොට) - එස්.වසන්ත වෙල්ගම මයා
- නියෝජ්‍ය කොමසාරිස් (බස්/ලොරි/ඉඩම් වාහන පැවරුම්) - ටී. වී. ධනසිංහම් මිය
- නියෝජ්‍ය කොමසාරිස් (යාපනය) - ආර්. සිවහරන් මයා
- සහකාර කොමසාරිස්(කාර්මික) - එච්.කේ.යූ. ජයසම්පත් මයා
- නියෝජ්‍ය කොමසාරිස් (යතුරු පැදි න.ලි.ප) - එම්.එම්.එම්.ජේ.මංචනායක මයා
- නියෝජ්‍ය කොමසාරිස් (පාලන) - එස්.ඒ.එන්.ආර්.කේ.ජයසිංහ මයා
- ගණකාධිකාරී (ප්‍රසම්පාදන) - එච්.එන්.එස්. පෙරේරා මිය
- ගණකාධිකාරී (ගෙවීම්) - ඩී.එන්. රාමනායක මිය
- ගණකාධිකාරී (ආදායම්) - එස්.එම්.පී. සමරකෝන් මයා
- අධ්‍යක්ෂ (වායු විමෝචන පරීක්ෂණ) - අයි.ජී.ඩී.අයි. කමල් මයා
- නීති නිලධාරී - කේ.අයි. යෝගචන්ද්‍ර මයා
- සහකාර අධ්‍යක්ෂ (තො.සං. තාක්ෂණය) - ඩබ්.එස්.එස්. දිසානායක මයා
- පරිපාලන නිලධාරිණී - වේරහැර - යූ.අයි. මුණසිංහ මිය
- පරිපාලන නිලධාරිණී - වේරහැර - කේ. ඉන්ද්‍රාදේවි මිය
- පරිපාලන නිලධාරී - කේ.කේ.වයි. සංජීවනී මිය
- පරිපාලන නිලධාරී (වේරහැර) - එස්.කේ.ගමගේ මයා
- පරිපාලන නිලධාරී (විමර්ශන) - එම්.එච්.යූ.පී.ශීලප්‍රිය මිය
- ජ්‍යෙෂ්ඨ සංඛ්‍යා ලේඛනඥ - ජයසම්පත් ලියනගේ මයා
- වැඩ සටහන් සම්පාදක - කේ.කේ.ආර්.සමරවීර මයා

1.5 දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ මඟ පෙන්වීම මත කොමසාරිස් (පාලන) විසින් දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු මෙහෙයවනු ලබන අතර, කොමසාරිස් (සංවර්ධන) විසින් සංවර්ධන කටයුතු මෙහෙයවනු ලබයි. දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය කොමසාරිස්වරයකු යටතේ පාලනය වන අතර, දෙපාර්තමේන්තුවේ විමර්ශන කටයුතු ද ඒ සඳහා පත් කළ කොමසාරිස්වරයකු යටතේ ක්‍රියාත්මක වේ. ඊට අමතරව වේරහැර උප කාර්යාලය ද ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධ වෙමින් කොමසාරිස්වරයකුගේ මූලික මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන අතර, අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල දිස්ත්‍රික් ලේකම්වරයකුගේ හෝ නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරයකුගේ පාලනයට යටත්ව පවතී. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය නාරාහේන්පිට පිහිටා ඇති අතර, වේරහැර උප කාර්යාලය හා දීප ව්‍යාප්තව ස්ථානගත කර ඇති දිස්ත්‍රික් කාර්යාල, ප්‍රධාන කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක වෙයි.

ප්‍රධාන කාර්යාලයේ ශාඛාවන්

i. කොමසාරිස් ජනරාල් කාර්යාලය
ii. ආයතන ශාඛාව
iii. සංවර්ධන ශාඛාව
iv. ගිණුම් ශාඛාව
v. පරිගණක හා තොරතුරු තාක්ෂණ ශාඛාව
vi. අභ්‍යන්තර විගණන හා විමර්ශන ශාඛාව
vii. නීති ශාඛාව
viii. සුඛෝපභෝගී බදු ශාඛාව
ix. තැපැල් ශාඛාව
x. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව
xi. යතුරු පැදි හා ත්‍රීරෝද රථ නව ලියාපදිංචි ශාඛාව
xii. මෝටර් කාර් පැවරුම් ශාඛාව
xiii. වෙළඳ වාහන පැවරුම් ශාඛාව
xiv. ලොරි පැවරුම් ශාඛාව
xv. බස් හා ඉඩම් වාහන පැවරුම් ශාඛාව
xvi. ත්‍රීරෝද රථ පැවරුම් ශාඛාව
xvii. යතුරු පැදි පැවරුම් ශාඛාව
xviii. කාර්මික ශාඛාව
xix. අංක තහඩු (කොළඹ) ශාඛාව
xx. අංක තහඩු (පිට පළාත්) ශාඛාව
xxi. ලේඛනාගාර I
xxii. ලේඛනාගාර II
xxiii. සංඛ්‍යාලේඛන ශාඛාව

ප්‍රධාන කාර්යාලයේ අංශයන්ගේ කාර්ය භාරය

i. කොමසාරිස් ජනරාල් කාර්යාලය

සේවාලාභී මහජනතාවගේ අවශ්‍යතා පදනම් කර ගනිමින්, එකී අවශ්‍යතාවයන් සපුරාලීම වෙනුවෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්තුමාගේ කාර්යභාරයන් සඳහා සහාය වීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වන අතර, මෙම අංශය මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්තුමාගේ මඟ පෙන්වීම ඔස්සේ ක්‍රියාත්මක වේ.

ii. ආයතන ශාඛාව

''සුභවාදී සිතුවිලි තුළින් ඵලදායී රාජ්‍ය සේවයක්" යන ආංශික දැක්ම ඔස්සේ ආයතන අංශය ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තුවේ පරිපාලනය භාර කොමසාරිස්ගේ මඟ පෙන්වීම මත මූලික වශයෙන් දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලයේ ආයතන හා පරිපාලන කටයුතු ඉටු කිරීම සහ අනෙකුත් යටිතල පහසුකම් ඇතුළු දෙපාර්තමේන්තුවේ නඩත්තු කටයුතු මෙම අංශයේ ප්‍රධාන කාර්යය වන අතර, කාර්ය මණ්ඩලය පත් කිරීම්, මාරු කිරීම්, උසස් කිරීම්, විශ්‍රාම ගැන්වීම, සේවා දීර්ඝ ලබා දීම, විනය කටයුතු සිදු කිරීම සහ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම ද, ඊට අමතරව වැටුප් වර්ධක අනුමත කිරීම, විවිධ ණය වර්ග අනුමත කිරීම, අග්‍රහාර රක්ෂණ බිල්පත් නිරවුල් කිරීම, ජලය, දුරකථන, විදුලි බිල්පත් පියවීම ද මෙම අංශය තුළින් සිදුකරනු ලබන කාර්යයන් වේ. තැපැල් ශාඛාව හා ලේඛනාගාර I, ලේඛනාගාර II යන අංශයන් වල කටයුතු ද ආයතන අංශයේ පරිපාලනයට යටත්ව ක්‍රියාත්මක වේ.

iii. සංවර්ධන ශාඛාව

"තෘප්තිමත් සේවක සමූහය තුළින්, ඉහළ මහජන ප්‍රසාදයක්" යන ආංශික දැක්ම ඔස්සේ මෙම අංශයේ කටයුතු ක්‍රියාත්මක වේ. සංවර්ධන අංශය භාර කොමසාරිස්ගේ මඟ පෙන්වීම මත මෙම අංශය ක්‍රියාත්මක වන අතර, වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නංවමින් කාර්යාල පද්ධතියේ ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු පවත්වාගෙන යාම, සේවක අභිප්‍රේරණය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, දෙපාර්තමේන්තුවේ සියලු අංශවල සහ ප්‍රාදේශීය කාර්යාල වල ප්‍රගතිය සමාලෝචනය, අමාත්‍යාංශ හා වෙනත් අංශවලට යොමු කළ යුතු සියලුම ප්‍රගති වාර්තා, අයවැය වාර්තා, කාර්ය සාධන වාර්තා, ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු වැනි දෙපාර්තමේන්තුවේ වැදගත් කාර්යයන් රැසක් මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

iv. ගිණුම් ශාඛාව

"නිවැරදි වූත් විනිවිද වූත් ඵලදායි මූල්‍ය කළමණාකරණයෙන් ආයතනික අභිවෘද්ධිය" යන ආංශික දැක්ම මුල් කර ගනිමින්, ආදායම් වියදම් පිළිබඳ සියලු කටයුතු ගිණුම්ගත කිරීම සහ මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම, විගණන විමසුම් හා රාජ්‍ය ගිණුම් කාරක සභාවට සැපයිය යුතු වාර්තා නිසි පරිදි සැපයීම, මුදල් රෙගුලාසි 135 යටතේ බලතල පැවරීමට අදාළ කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා සහාය වීම ගිණුම් අංශයේ කාර්යභාරය වේ.

v. **පරිගණක හා තොරතුරු තාක්ෂණ ශාඛාව**

දෙපාර්තමේන්තු දැක්ම හා මෙහෙවර උදෙසා අවශ්‍ය වන නවීන තාක්ෂණික ක්‍රම හඳුන්වා දෙමින් පරිගණක ගත තාක්ෂණික කටයුතු කළමනාකරණය කිරීම සහ දෙපාර්තමේන්තුව වෙත තාක්ෂණික සේවා සපයනු ලබන අනෙකුත් බාහිර ආයතන සම්බන්ධීකරණය කිරීමත් සියලු අංශ සඳහා අදාළ තාක්ෂණික සේවා සැපයීමත් ප්‍රධාන කාර්යභාරය වන අතර, අවශ්‍ය අවස්ථාවන්හි දී තොරතුරු නිකුත් කිරීම ද මෙම අංශයෙන් සිදු කරනු ලබයි.

vi. **අභ්‍යන්තර විගණන හා විමර්ශන ශාඛාව**

"විගණන හා විමර්ශන කටයුතු තුළින් ඉහළ ඵලදායිතාව" යන ආංශික දැක්ම ඔස්සේ දෙපාර්තමේන්තුවට සියලුම ශාඛා කාර්යාලවල අභ්‍යන්තර විගණන කටයුතු හා විමර්ශනය සිදු කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ කටයුතු නිවැරදි ගමන් මඟක ගෙන යාම සඳහා සහාය වීමත් මෙම අංශයේ කාර්යභාරය වේ.

vii. **නීති ශාඛාව**

"සාධාරණත්වය නීතියට ඉදිරියෙන්" යන ආංශික දැක්ම ඔස්සේ ක්‍රියාත්මක වෙමින් දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලිය පවත්වා ගෙන යාමට අවශ්‍ය නෛතික සංශෝධනයන් පනත් කෙටුම්පත් හරහා ගෙන ඒමත් නීතිමය කටයුතු සඳහා දායකත්වය ලබා දෙමින් දෙපාර්තමේන්තුවට එරෙහි නඩු පැවරීම් වලදී නීතිපති දෙපාර්තමේන්තුව හා අනෙකුත් පාර්ශව සම්බන්ධීකරණය කරමින් ඒ වෙනුවෙන් පෙනී සිටීමත් සහ මෝටර් වාහන සම්බන්ධයෙන් වන නීතිමය තත්ත්වයන් සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම සිදු කරනු ලබයි.

viii. **සුඛෝපභෝගී බදු ශාඛාව**

"විධිමත් බදුකරණය තුළින් ජාතික සංවර්ධනයට උර දීම" යන ආංශික දැක්ම මත ක්‍රියාත්මක වෙමින් 1995 අංක 16 දරන මුදල් පනත හා සංශෝධිත පනත් යටතේ සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්යය බදු අයකිරීම සිදුකරන රක්ෂණ ආයතන කළමනාකරණය කිරීම හා මඟ පෙන්වීම, බදු ගෙවීම පිළිබඳ වාහන හිමියන් දැනුවත් කිරීම සහ හිඟ බදු අයකිරීම, බදු ගෙවීම සම්බන්ධව ඒ, ඒ වාහන වෙනුවෙන් පරිගණක පද්ධතිය පවත්වාගෙන යාම, බදු ආදායම් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම හා ආදායම් වාර්තා සකස් කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ.

ix. **වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව**

"වෙළඳ වාහන නව ලියාපදිංචි කිරීම තුළින් මෝටර් වාහන නියාමනයෙන් ඉහළ මහජන ප්‍රසාදය" යන ආංශික දැක්ම ඔස්සේ ක්‍රියාත්මක වෙමින් විශේෂ කාර්යය වාහන, ද්විත්ව කාර්යය වාහන, මෝටර් ලොරි, මෝටර් කාර් හා ත්‍රිවිධ හමුදා මගින් මිලදී ගන්නා, රාජසන්තක කර වෙන්දේසි කරන ලද වාහන ලියාපදිංචි කර ලියාපදිංචි සහතික නිකුත් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. ඊට අමතරව රජයේ ප්‍රතිපත්ති අනුව වාහන සඳහා ඉදිරි අංක වෙන් කිරීම හා ඒ සඳහා ගාස්තු අයකිරීම සිදුකරනු ලබයි.

x. **යතුරුපැදි හා ත්‍රී රෝද රථ නව ලියාපදිංචි ශාඛාව**

ශ්‍රී ලංකාව තුළ මෙතෙක් ලියාපදිංචි නොවූ ත්‍රී රෝද රථ සහ යතුරුපැදි පළමු වරට ලියාපදිංචි කිරීම හා ඊට අදාළ සියලු කාර්යයන් ඉටු කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. ඊට අමතරව තානාපති කාර්යාලයන්හි වාහන පැවරීම ලියාපදිංචිය, එම වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීම සහ එම වාහන රටින් බැහැර ගෙන යාමට අදාළ කාර්යයන් ඉටුකරනු ලැබේ.

xii. **වාහන අයිතිය පැවරීමේ ශාඛා**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ මූලික ලියාපදිංචිය සිදුකර ඇති සියලුම වාහනවල අයිතිය නැවත පැවරීම, ලියාපදිංචි කිරීම මෙම ශාඛා තුළින් සිදු කරයි. මෙම වාහන පැවරීමේ කාර්යය සඳහා ඒ, ඒ වාහන වර්ගය අනුව පැවරුම් අංශ හයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර ඇත. එනම්,

- ❖ කාර් පැවරුම් අංශය
- ❖ වෙළඳ වාහන පැවරුම් අංශය
- ❖ ත්‍රිරෝද රථ පැවරුම් අංශය
- ❖ යතුරුපැදි පැවරුම් අංශය
- ❖ ලොරි පැවරුම් අංශය
- ❖ බස් හා ඉඩම් වාහන පැවරුම් අංශය

මෙම සෑම අංශයක්ම කොමසාරිස්වරයකුගේ හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකුගේ හෝ සහකාර කොමසාරිස්වරයකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන අතර, තම කාර්යයන් සාමාන්‍ය සේවා හා එක්දින සේවා පහසුකම් යටතේ සිදු කරනු ලබයි. මෙම සියලුම අංශයන්ගේ කාර්යභාරය පොදුවේ පහත පරිදි දැක්විය හැක.

- ★ පැවරීම ලියාපදිංචි කිරීම.
- ★ පරම අයිතිය හෝ උකසක් සහිතව පැවරීම ලියාපදිංචි කිරීම.
- ★ පරම අයිතිය හෝ උකසක් අවලංගු කර පැවරීම ලියාපදිංචි කිරීම.
- ★ ලියාපදිංචි සහතිකයේ අනු පිටපත් නිකුත් කිරීම.
- ★ විධිමත් අයුරෙන් සිදු කරන භෞතික වෙනස්කම් මෙන්ම ලේඛනමය වෙනස්කම් ද ලියාපදිංචි සහතිකයේ ඇතුළත් කිරීම.

  උදා :- එංජින් අංකය, වර්ණය, ලිපිනය

- ★ නව ඉංග්‍රීසි අක්ෂර සහිත වාහනවල අංක තහඩු හා ස්ටිකර්වල අනු පිටපත් නිකුත් කිරීම සඳහා දත්ත පරිගණක ගත කිරීම.
- ★ පැවරීමක් සඳහා පැවරුම් ශාඛාවට අයදුම්පත් ඉදිරිපත් කර ඇති වාහන සඳහා ආදායම් බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය MTA-11 ලේඛන සනාථ කර නිකුත් කිරීම.
- ★ නෛතික කටයුතු සඳහා අවශ්‍ය වන සහතික කරන ලද පරිගණක උධෘත නිකුත් කිරීම හා ලැබෙන විරෝධතා සටහන් කර ගැනීම.

xiii. **කාර්මික ශාඛාව**

වාහන ලියාපදිංචි කිරීමට අදාළව සපයනු ලබන කාර්මික සේවාවන් වන වාහන පරීක්ෂා කිරීම, බර සහතික නිකුත් කිරීම හා අනෙකුත් කාර්මික සේවාවන් සැපයීම මෙන්ම ඒ සම්බන්ධ අවශ්‍ය උපදෙස් ලබා දීම කාර්මික ශාඛාව මගින් සිදුකරනු ලැබේ. මෙම අංශය සහකාර කොමසාරිස් (කාර්මික) යටතේ ක්‍රියාත්මක වන අතර, මෝටර් රථ පරීක්ෂකවරුන්ගේ අධීක්ෂණ කටයුතු පවත්වා ගෙන යමින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත සහාය වීමද මෙම අංශයේ කාර්යභාරයන් අතර වේ.

වේරහැර රියදුරු බලපත්‍ර කාර්යාලය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව ක්‍රියාත්මක වන වේරහැර කාර්යාලය තුළින් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වන රියදුරු බලපත්‍ර නිකුත් කිරීම හා රියදුරු පාසල් නියාමනයට අදාළ සියලු කාර්යයන් සිදුකරනු ලබයි. ඊට අමතරව වාහන පරීක්ෂාව හා බර සහතික නිකුත් කිරීමේ කටයුතු ද මෙම කාර්යාලයෙන් සිදු කරනු ලබයි. මෙම කාර්යාලයේ සියලුම පරිපාලන සහ කළමනාකරණ කටයුතු කොමසාරිස්වරයෙකු සහ නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරයකු මගින් පාලනය වේ.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය දීප ව්‍යාප්ත කරමින්, සේවාලාභීන්ට තම දිස්ත්‍රික්කය තුළදීම උපරිම සේවයක් ලබාදීමේ අරමුණින්, සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් කාර්යාල පිහිටුවා ඇත. සියලු දිස්ත්‍රික් කාර්යාල දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ පවත්වා ගෙන යන අතර, ඒ අතරින් ගම්පහ, හම්බන්තොට හා කුරුණෑගල කාර්යාල නියෝජ්‍ය කොමසාරිස්වරුන් යටතේ සහ යාපනය හා අනුරාධපුරය කාර්යාල සහකාර කොමසාරිස්වරුන් යටතේ ක්‍රියාත්මක වේ. මීට අමතරව සියලුම දිස්ත්‍රික් කාර්යාලවලට ප්‍රධාන මෝටර් රථ පරීක්ෂකවරයෙක් හා මෝටර් රථ පරීක්ෂකවරුන් අනුයුක්ත කර ඇත.

මෙම දිස්ත්‍රික් කාර්යාල මගින් මූලික වශයෙන් රියදුරු බලපත්‍ර සඳහා අයදුම්පත් භාර ගැනීම, බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම ද සිදු කරනු ලබන අතර, මේ යටතේ අනුරාධපුරය හා හම්බන්තොට යන දිස්ත්‍රික් කාර්යාල මගින් රියදුරු බලපත් මුද්‍රණය කර නිකුත් කිරීම සිදු කරනු ලබයි. මාර්ගගත ක්‍රමය (online) යටතේ රියදුරු බලපත්‍ර සම්බන්ධ කටයුතු කුරුණෑගල, ගම්පහ, අනුරාධපුරය, හම්බන්තොට, යාපනය, කළුතර, මොනරාගල, මහනුවර සහ ගාල්ල යන දිස්ත්‍රික් කාර්යාල මගින් සිදු කළ ද එහිදී සිදු කරනුයේ රියදුරු බලපත් නිකුත් කිරීම සඳහා අයදුම්පත් භාර ගැනීමට අදාළ කටයුතු පමණි. ඒ සඳහා වන රියදුරු බලපත් නිකුත් කරනු ලබන්නේ වේරහැර කාර්යාලය මගිනි. අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ දී මාර්ග අපගත ක්‍රමය (off line) භාවිතා කරයි.

මෙම කාර්යයන්ට අමතරව වෙන් කරන ලද අංක මත දිස්ත්‍රික්කයට අදාළ යතුරුපැදි නව ලියාපදිංචි කිරීම, දිස්ත්‍රික්කය තුළ එම යතුරුපැදි පැවරීම ලියාපදිංචි කිරීම, බර සහතික නිකුත් කිරීම හා කාර්මික සේවාවන්ට අදාළ කටයුතු ද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීම සඳහා පැවරුම් වලට අදාළ සියලු කටයුතු වෙනුවෙන් අයදුම්පත් භාර ගැනීම ද දිස්ත්‍රික් කාර්යාල මගින් සිදුකරනු ලබයි.

දිස්ත්‍රික් කාර්යාල ව්‍යාප්තිය



1.1 දිස්ත්‍රික් කාර්යාලවල පිහිටීම

02 පරිච්ඡේදය

දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය

2.1 ධාවනය කළ හැකි මෝටර් වාහන නව ලියාපදිංචිය

මෙරටට ආනයනය කරන ලද හෝ මෙරට නිෂ්පාදනය කරන ලද හෝ එකලස් කරන ලද වාහන ශ්‍රී ලංකාව තුළ ප්‍රථමවරට ලියාපදිංචි කිරීම මෙම කාර්යය යටතේ සිදු කරනු ලබයි. මෙම ලියාපදිංචි කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 02 මගින් සිදු කරනු ලබයි.
එනම්,

1. යතුරුපැදි හා ත්‍රීරෝද රථ නව ලියාපදිංචි ශාඛාව
2. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව (කාර්, ලොරි, ද්විත්ව කාර්යය වාහන, සින්ගල් කැබ්, ප්‍රයිම්මුවර්, අවමංගල්‍ය රථ, ගිලන් රථ, බස් රථ සහ ට්‍රැක්ටර්)

මෙම වාහනවල පළමු ලියාපදිංචි සහතිකය නිකුත් කිරීමේ දී අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලිපි ලේඛනවල නිරවද්‍යතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව ලියාපදිංචි ගාස්තු ගෙවීමෙන් පසු එක් දිනකින් ලියාපදිංචි කටයුතු අවසන් කර අදාළ ලියාපදිංචි සහතිකය නිකුත් කරනු ලබයි.

2022 වර්ෂය තුළ ලියාපදිංචි නව මෝටර් වාහන ප්‍රමාණය 20,511ක් වන අතර, ඒ අනුව මුළු මෝටර් වාහන ගහනය 8,352,213 ක් වේ. ලියාපදිංචි නව වාහන ප්‍රමාණය වසර 2021 ට සාපේක්ෂව -39.40% ක අඩු වීමකි. එම සංඛ්‍යාත්මක අගයන් පහත ලෙස සාරාංශ කළ හැක.

2.1.1 වගුව :- වාහන ගහනය

වර්ෂය	ප්‍රමාණය	මුළු වාහන ගහනය
2012	397,295	4,877,027
2013	326,651	5,203,678
2014	429,556	5,633,234
2015	668,907	6,302,141
2016	493,328	6,795,469
2017	451,653	7,247,122
2018	480,799	7,727,921
2019	367,303	8,095,224
2020	202,628	8,297,852
2021	33,850	8,331,702
2022	20,511	8,352,213

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2022 වර්ෂයේ නව ලියාපදිංචි වූ වාහන සංඛ්‍යාව පහත ප්‍රස්ථාරයෙන් දැක්වේ.

2.1.1 රූපසටහන



මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ වාහන නව ලියාපදිංචිය සලකා බැලීමේ දී 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ අඩු වීමක් සිදු වී ඇත.

2.1.2 රූපසටහන



මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2.1.2 වගුව :- නව ලියාපදිංචි වාහන කාණ්ඩ

වාහන පන්තිය	2021.12.31 දිනට වාහන	2022.12.31 දිනට වාහන	වැඩිවීම/අඩුවීම ප්‍රතිශතයක් ලෙස
මෝටර් කාර්	3,495	1,489	-57.39
ත්‍රීරෝද රථ	2,093	36	-98.27
මෝටර් සයිකල්	8,011	9,060	13.09
මෝටර් බස්	281	404	43.77
ද්විත්ව කාර්යය වාහන	771	760	-1.42
මෝටර් ලොරි	4,432	1,832	-58.66
ඉඩම් වාහන ට්‍රැක්ටර්	10,420	4,369	-58.07
ඉඩම් වාහන (ට්‍රේලර්)	4,344	2,560	-41.06
ක්‍රොඩ් සයිකල්	-	-	-
මෝටර් නිවාස	3	-	-100
වෙනත්	-	1	1
එකතුව	33,850	20,511	-39.40

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2022 වසරේ ලියාපදිංචි වූ නව වාහන කාණ්ඩ

2.1.3 රූපසටහන



මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2021 වර්ෂයට සාපේක්ෂව වාහන ලියාපදිංචිය සලකා බැලීමේ දී බොහෝ වාහන කාණ්ඩවල ලියාපදිංචියේ සංඛ්‍යාත්මක අගයන්හි පහළ යාමක් දැකිය හැකිය. වාහන ආනයනය සම්බන්ධව රජයේ ප්‍රතිපත්තිය, මෙන්ම කල්බදු ලබා දීමේ ප්‍රතිශතයන් සීමා කිරීම ඇතුළු සාධක මේ කෙරෙහි බලපා ඇත. ඉහත වාහන ලියාපදිංචියේ සංඛ්‍යාත්මක අගයන් සලකා බැලීමේදී මෝටර් කාර්, ත්‍රීරෝද රථ හා යතුරු පැදි ලියාපදිංචිය තුළින් ලංකාව තුළ ඉහළ යන වාහන ගහණය සඳහා ඉහළ දායකත්වයක් ලබා දෙන බව පෙන්වා දිය හැක. එම වාහන කාණ්ඩ 3හි ලියාපදිංචිය පහත සඳහන් පරිදි වෙන් වෙන් වශයෙන් දැක්විය හැකිය.

2022 වර්ෂයේ මෝටර් කාර් නව ලියාපදිංචිය

2.1.3 වගුව :- නව ලියාපදිංචි මෝටර් කාර් දත්ත

මාසය	වාහන ප්‍රමාණය
ජනවාරි	183
පෙබරවාරි	113
මාර්තු	149
අප්‍රේල්	131
මැයි	114
ජුනි	83
ජූලි	87
අගෝස්තු	104
සැප්තැම්බර්	177
ඔක්තෝබර්	120
නොවැම්බර්	41
දෙසැම්බර්	187

2.1.4 රූපසටහන



මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2.1.4 වගුව :- නව ලියාපදිංචි මෝටර් කාර් දත්ත (2013 - 2022)

වර්ෂය	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022
ලියාපදිංචි වූ මෝටර් කාර් සංඛ්‍යාව	28,380	38,780	105,628	45,172	39,182	80,776	38,232	21,021	3,495	1,489

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2.1.5 රූප සටහන



මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2022 වර්ෂයේ යතුරු පැදි නව ලියාපදිංචිය

2.1.5 වගුව :- නව ලියාපදිංචි යතුරු පැදි දත්ත

මාසය	වාහන ප්‍රමාණය
ජනවාරි	395
පෙබරවාරි	394
මාර්තු	458
අප්‍රේල්	958
මැයි	1,153
ජුනි	1,042
ජූලි	675
අගෝස්තු	1,134
සැප්තැම්බර්	858
ඔක්තෝබර්	712
නොවැම්බර්	584
දෙසැම්බර්	697

2.1.6 රූපසටහන



මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2.1.6 වගුව :- නව ලියාපදිංචි යතුරු පැදි දත්ත (2013 - 2022)

වර්ෂය	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022
ලි.ප. යතුරුපැදි සංඛ්‍යාව	169,280	272,885	370,889	340,129	344,380	339,763	284,301	151,634	8,011	9,060

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2.1.7 රූපසටහන



මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2022 ත්‍රීරෝද රථ නව ලියාපදිංචිය

2.1.7 වගුව :- නව ලියාපදිංචි ත්‍රීරෝද රථ

මාසය	වාහන ප්‍රමාණය
ජනවාරි	3
පෙබරවාරි	5
මාර්තු	5
අප්‍රේල්	1
මැයි	3
ජූනි	1
ජූලි	-
අගෝස්තු	-
සැප්තැම්බර්	9
ඔක්තෝබර්	2
නොවැම්බර්	-
දෙසැම්බර්	-

2.1.8 රූපසටහන



මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2.1.8 වගුව :- නව ලියාපදිංචි ත්‍රීරෝද රථ (2013 - 2022)

වර්ෂය	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022
ලි.ප. ත්‍රීරෝද රථ සංඛ්‍යාව	83,673	79,038	129,547	56,945	23,537	20,063	15,490	7,150	2,093	29

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2.1.9 රූප සටහන



මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

අලුතින් ලියාපදිංචි වන මෙම වාහන භාවිතා කරනු ලබන ඉන්ධන වර්ගය අනුව ප්‍රධාන වශයෙන් කාණ්ඩ 03 ක් යටතේ වර්ග කළ හැක. එනම්,

- ✓ පෙට්‍රල් භාවිතා කරන වාහන
- ✓ ඩීසල් භාවිතා කරන වාහන
- ✓ වෙනත්

- පෙට්‍රල් / ඉලෙක්ට්‍රිකල් වාහන
- ඩීසල් / ඉලෙක්ට්‍රිකල් වාහන
- ඉලෙක්ට්‍රික් වාහන
- ඉන්ධන භාවිතා නොකරන වාහන

2.1.10 රූපසටහන

ඉන්ධන වර්ගය අනුව නව ලියාපදිංචිය - 2022



මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2022 වර්ෂය තුළ පෙට්‍රල් භාවිතයෙන් ධාවනය වන වාහන 9,602 ක් ද, ඩීසල් භාවිතයෙන් ධාවනය වන වාහන 7,386 ක් ද ලියාපදිංචි වී ඇති අතර, ඉන්ධන භාවිතයක් රහිත වාහන 3,522 ක් ද ලියාපදිංචි වී ඇත. ලියාපදිංචි වූ මුළු වාහන ප්‍රමාණයෙන් පෙට්‍රල් භාවිතයෙන් ධාවනය වන වාහන ප්‍රමාණය 46% ක් ද, ඩීසල් වාහන ප්‍රමාණය 36% ක් ද වේ.

2.2 වාහන හිමිකම් පැවරීම ලියාපදිංචි කිරීම

ලියාපදිංචි කළ වාහන නැවත පැවරීම ලියාපදිංචි කිරීම සලකා බැලීමේදී 2022 වර්ෂයේදී සිදු කළ පැවරුම් සංඛ්‍යාව 612,877 කි. වාහන පැවරුම්වල සිදු වූ වර්ධනයේ ප්‍රවණතාවය පහත රූප සටහන තුළින් දැක්විය හැක. හිමිකම් පැවරීමේ ක්‍රියාවලිය රට තුළ මහජනයා අතර වාහනවල අයිතිය සංසරණය වීමේ ස්වභාවය පෙන්නුම් කරයි. සෑම වර්ෂයකම යම් ඉහළ යාමක් පෙන්නුම් කිරීම මෙහි කැපී පෙනෙන ලක්ෂණයකි.

2.2.1 රූපසටහන



මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

ඉහත රූප සටහන අනුව 2021 වසරේදී සිදු කරන ලද 671,026 පැවරුම් සංඛ්‍යාවට සාපේක්ෂව 2022 වර්ෂයේදී සිදු කළ පැවරුම් සංඛ්‍යාව 58,149 කින් පහළ ගොස් ඇත.

2022 වසරේ පැවරුම් ප්‍රමාණය ඒ ඒ වාහන කාණ්ඩ අනුව පහත පරිදි වෙන් කර දැක්විය හැක.

2.2.1 වගුව :- වාහන පැවරුම් සංයුතිය

වාහන වර්ගය	2021	2022
කාර් පැවරුම්	147,105	103,765
ත්‍රීරෝද රථ/ත්‍රීවිලර් වෑන්/ ත්‍රීවිලර් කාර් පැවරුම්	181,742	142,586
යතුරු පැදි පැවරුම්	200,366	262,589
වෙළඳ වාහන පැවරුම්	82,420	55,950
ලොරි පැවරුම්	41,733	28,883
බස් පැවරුම්	8,815	9,800
ඉඩම් වාහන පැවරුම්	8,842	9,300
මෝටර් නිවාස	3	-
වෙනත්	-	4
එකතුව	671,026	612,877

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2.2.2 රූපසටහන



2.3 රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ සේවාව

රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාපිළිවෙල හා එහි ස්වභාවය දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට අවස්ථා ගණනකදී විකාශනය වෙමින් වර්තමානයේ නිකුත් කරනු ලබන, ජාත්‍යන්තර ප්‍රමිතියකින් යුතු නව ස්මාර්ට් කාඩ් රියදුරු බලපත්‍රය දක්වා විකාශනය වී ඇත. මෙම ස්මාර්ට් කාඩ් රියදුරු බලපත්‍රය ව්‍යාජ ලෙස මුද්‍රණය කිරීම වැළැක්වීම සඳහා උසස් තත්ත්වයේ ආරක්ෂණ උපක්‍රම භාවිතා කර ඇති අතර, මෙහි බලපත්‍ර දරන්නාගේ රුධිර ගණයද ඇතුළත් කර ඇත. වේරහැර උපකාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල හරහා රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ආකාර දෙකක් මගින් සිදු කරනු ලබයි.

එනම්,

1. **On line** (මාර්ග ගත සම්බන්ධතාවය)

මෙම ක්‍රමය යටතේ රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමට පැමිණෙන සේවාලාභියාගේ මූලික තොරතුරු පරිගණක ගත කර එම වැඩසටහන හරහාම ඡායාරූප ලබා ගැනීම, ඇඟිලි සලකුණු හා අත්සන් ලබා ගැනිමත් ඊට අදාළ මූලික ලේඛන පරිලෝකනය (SCAN) කර දත්ත පද්ධතියට තොරතුරු තහවුරු කිරීමෙන් පසු රියදුරු බලපත්‍රය නිකුත් කිරීමත් මේ යටතේ සිදු වේ. මීට අමතරව ලිඛිත පරීක්ෂණ සිදු කර එම අවස්ථාවේම දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීමත් රියදුරු බලපත්‍රයේ උද්ධෘතයන් ඉල්ලුම් කරන අවස්ථාවකදී අවස්ථෝචිතව නිකුත් කිරීමත් සිදු කරනු ලබයි. මේ සඳහා වේරහැර කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් කළුතර, ගම්පහ, ගාල්ල, හම්බන්තොට, මහනුවර, යාපනය, කුරුණෑගල, අනුරාධපුර හා මොණරාගල යන දිස්ත්‍රික් කාර්යාල වල ක්‍රියාත්මකවේ.

2. **Off Line** (මාර්ගගත නොවන සම්බන්ධතාවය)

අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ දී ලිඛිත පරීක්ෂණ සිදු කිරීම, ආකෘති පත්‍ර හරහා අයදුම්පත් හා ලිපි ලේඛන ලබා ගැනීමෙන් අනතුරුව එම තොරතුරු තහවුරු කර වේරහැර කාර්යාලය වෙත යොමු කර රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබයි. මෙහිදී සේවාලාභියා වෙත තාවකාලික රියදුරු බලපත්‍රයක් දිස්ත්‍රික් කාර්යාලය හරහා නිකුත් කිරීම සිදු කෙරේ.

රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ කාර්යය පුද්ගලික අංශය මඟින් සිදු කළ අතර, අමප/20/0691/225/024 අංක දරණ සහ 2020.04.22 වෙනි දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, 2021.01.01 දින සිට එම කාර්යය ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් ඉටු කරනු ලබයි.

2.3.1 වගුව :- රියදුරු බලපත් නිකුත් කිරීම 2022

මාසය	2022.12.31 දිනට නිකුත් කළ බලපත්‍ර ප්‍රමාණය
ජනවාරි	71,881
පෙබරවාරි	75,947
මාර්තු	92,139
අප්‍රේල්	65,839
මැයි	59,821
ජුනි	76,165
ජූලි	44,428
අගෝස්තු	74,854
සැප්තැම්බර්	83,271
ඔක්තෝබර්	77,714
නොවැම්බර්	79,007
දෙසැම්බර්	75,852
එකතුව	876,918

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

වර්ගය	2022.12.31 දිනට නිකුත් කළ බලපත්‍ර ප්‍රමාණය
සංශෝධන	37,327
පරිවර්තන	18,965
අනුපිටපත්	39,581
වාහන පංති එකතු කිරීම	66,124
නව රියදුරු බලපත්‍ර	302,412
අලුත් කිරීම්	409,529
විදේශ රියදුරු බලපත්‍ර පරිවර්තන	2,746
අවලංගු කළ රියදුරු බලපත්‍ර	-
ලයිව් ස්කෑන් පමණක්	234
එකතුව	876,918

2022 දෙසැම්බර් 31 දින දක්වා නිකුත් කර ඇති මුළු රියදුරු බලපත් සංඛ්‍යාව 876,918 ක් වන අතර, කාඩ්පත් හිඟතාවය නිසා නිකුත් කර ඇති කාඩ්පත් සංඛ්‍යාව 128,234 කි. වේරහැර කාර්යාලයේ රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමට අමතරව හම්බන්තොට හා අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාල සඳහා රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ පහසුකම් සපයා ඇත.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තොරතුරු තාක්ෂණයේ ඉදිරි පියවරක් තබමින් රියදුරු බලපත්‍ර ලිඛිත විභාගය පරිගණක ආශ්‍රයෙන් (Touch Screen) ක්‍රියාත්මක කිරීම වේරහැර කාර්යාලයේ සිදු කරන අතර, ඉදිරියේදී මෙම ක්‍රමය අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල වෙතද ලබා දීමට බලාපොරොත්තු වේ.

2.4 මෝටර් වාහන සම්බන්ධ කාර්මික සේවාව

කාර්මික සේවාව සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයෙන් වේරහැර උප කාර්යාලයෙන් හා සියලුම දිස්ත්‍රික් කාර්යාල වලින් සිදු කරන කාර්යයන් පොදුවේ පහත ලෙස දැක්විය හැක.

- රියදුරු බලපත්‍ර සම්බන්ධ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම.
- වාහන පරීක්ෂාකර බර සහතික නිකුත් කිරීම, අනන්‍යතා සහතික නිකුත් කිරීම.
- රජයේ වාහන සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීම.

- වාහන සම්බන්ධ ටෙන්ඩර් මණ්ඩල සඳහා සහභාගී වීම, වාහන ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා නිර්දේශ ලබා දීම.
- කාර්මික ගරාජ ලියාපදිංචි කිරීම් සහ වාර්ෂික බලපත්‍ර අලුත් කිරීම.
- CMT වැසි අංක, ට්‍රේලර වැසි අංක නිකුත් කිරීම.
- රියදුරු උපදේශක පාඨමාලා සහ කාර්මික අංශයට අදාළ පුහුණු පාඨමාලා සකස් කර ක්‍රියාත්මක කිරීම.
- බරපතල අනතුරු සම්බන්ධ වාහන පරීක්ෂා කර, නිරීක්ෂණ අධිකරණය වෙත වාර්තා කිරීම.

ප්‍රධාන කාර්යාලය ඇතුළු අනිකුත් කාර්යාල වලින් සිදු කරනු ලබන කාර්මික සේවාවන් ප්‍රධාන කාණ්ඩ දහනවයක් (19) යටතේ වර්ග කර දැක්විය හැකි අතර, එම එක් එක් කාණ්ඩයන්ට අදාළ සංඛ්‍යාත්මක දත්ත පහත 2.4.1 වගුව මඟින් සාරාංශ කර පහත පරිදි දැක්විය හැක.

2.4.1 වගුව :- කාර්මික සේවාවන්

	කාර්යය	2021	2022
1.	රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ ලිඛිත පරීක්ෂණ පැවැත්වීම	215,565	693,492
2.	රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම	290,527	674,291
3.	අංක තහඩු නිකුත් කිරීම (කොළඹ)	122,020	339,194
4.	අංක තහඩු නිකුත් කිරීම (පිට පළාත්)	287,808	361,173
5.	ගරාජ, නව වෙළඳ ආයතන පරීක්ෂා කිරීම	40	24
6.	ගරාජ, නව වෙළඳ ආයතන ලියාපදිංචි කිරීම	27	24
7.	ගරාජ, නව වෙළඳ ආයතන අලුත් කිරීම	583	370
8.	රියදුරු පාසල් පරීක්ෂා කිරීම	610	-
9.	මූලාකෘති නිකුත් කිරීම	132	86
10.	C.M.T. වැසි අංක නිකුත් කිරීම	2	06
11.	ට්‍රේලර් වැසි අංක නිකුත් කිරීම	4,703	2,739
12.	රේගු වෙන්දේසි වාහන සඳහා C.M.T. වැසි අංක නිකුත් කිරීම	-	-
13.	යතුරුපැදි පරීක්ෂා කිරීම	5,629	28,342
14.	බර සහතික නිකුත් කිරීම	7,010	12,468
15.	අනන්‍යතා සහතික නිකුත් කිරීම	5,022	6,420
16.	තහනම් නියෝග නිකුත් කිරීම	2,242	4,584
17.	තහනම් නියෝග ඉවත් කිරීම	1,194	4,431
18.	රිය අනතුරු පරීක්ෂා කිරීම	20,310	29,424
19.	විශේෂ රාජකාරී සඳහා සහභාගී වීම	2,595	410

2.5 වායු විමෝචන තත්ත්වය නියාමනය

ප්‍රමිතියෙන් තොර වාහන භාවිතය නිසා සිදු වන පරිසර දූෂණය වළක්වමින් ඒ සඳහා දායකවන වාහන වලින් පිටවන දුම පාලනය කිරීමේ පරමාර්ථයෙන් 2008 ජනවාරි මස 25 වන දින නිකුත් කරන ලද අංක 1533/17 දරන අති විශේෂ ගැසට් නියෝගයත්, 2009 අංක 08 මෝටර් වාහන (සංශෝධන) පනත හා අංක 1557/14 ජාතික පරිසර (වායු විමෝචන ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති) අති විශේෂ ගැසට් පත්‍රය අනුව 2008 නොවැම්බර් මස 17 දින සිට ක්‍රියාත්මක වන පරිදි වායු විමෝචන පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී. එසේම නව ප්‍රමිතීන් 2014.11.05 දින ප්‍රකාශයට පත් කර ඇති අතර එම ප්‍රමිතීන් 2016 සැප්තැම්බර් මස 15 වන දින සිට ක්‍රියාත්මක කර ඇති අතර පුවත්පත් දැන්වීම් හා ප්‍රජා දැනුවත් කිරීම් සිදු කරන ලදී.

අප අවට වායු ගෝලයේ ගුණාත්මකභාවය මැනීම සඳහා වාහන වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල මඟින් සංසරණ වායු තත්ත්වය මැනීමේ ඒකක 03ක් මිලදී ගෙන ඇත. ස්ථිර ඒකක 02ක් මහනුවර නගරයේ හා බත්තරමුල්ල නගරයේ ස්ථාපනය කර ඇති අතර, එමගින් දත්ත ලබා ගැනීමට හා නඩත්තු කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත භාර දී ඇත. ජංගම ඒකකයේ දත්ත ලබා ගැනීම හා නඩත්තු කිරීම ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් සිදු කරනු ලබයි. මෙම ඒකක වලින් ලබා ගන්නා දත්ත වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහනේ ප්‍රතිඵල අධ්‍යයනය කිරීම සඳහා භාවිතා කරනු ලබයි.



ස්ථිර වායු තත්ත්වය මැනීමේ ඒකකය



ජංගම ඒකකය

එමෙන්ම, වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ ප්‍රතිපාදන මඟින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනය සහ පේරාදෙණිය හා මොරටුව විශ්වවිද්‍යාලයන්හි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් විසින් සිදු කරනු ලැබූ පර්යේෂණ වලින් ලබා දී ඇති දත්ත හා නිගමන ඉදිරි තත්ත්ව කළමනාකරණ වැඩ සටහන් සඳහා යොදා ගැනීමට කටයුතු සිදු කරනු ලබයි.

මාර්ගයේ ධාවනය වන වාහන පරීක්ෂා කිරීම සඳහා කණ්ඩායම් වශයෙන් මාර්ගස්ථ පරීක්ෂාවන් හා ස්ථානීය පරීක්ෂාවන් සිදු කරයි.

වගුව :- වාහන වායු විමෝචන අධීක්ෂණ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය - 2022

	වැඩසටහන		2021 සංඛ්‍යාව	2022 සංඛ්‍යාව
1.	මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම	Laugfs	128	135
		Cleanco	129	91
2.	මාර්ගස්ථ දුම් පරීක්ෂාව (Road side)		329	503
3.	ස්ථානීය දුම් පරීක්ෂාව (Spotter)		2132	655
4.	වේරහැර සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව		2233	641
5.	යුධ හමුදා හා ගුවන් හමුදා වාහන පරීක්ෂණ සංඛ්‍යාව		868	3276
6.	Viber හරහා එවන ලද පැමිණිලි		127	90
7.	අසාධු ලේඛන ගත කරන ලද වාහන		228	-
8.	මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සිදු කරනු ලබන මධ්‍යස්ථාන පරීක්ෂාවන්		875	5292



මධ්‍යස්ථාන නිරීක්ෂණය



ස්ථානීය පරීක්ෂාව



මාර්ගස්ථ පරීක්ෂාව

2.5.2. වගුව :- වාහන වායු විමෝචන භාරකාර අරමුදලේ මූල්‍ය තොරතුරු (2013 - 2022)

වර්ෂය	ලාෆ් එකෝ ප්‍රයිවට් ලිමිටඩ් (රු.)	ක්ලීන් කෝ ලංකා ප්‍රයිවට් ලිමිටඩ් (රු.)	සමුච්චිත ආදායම (රු.)
2013	92,209,025	70,110,706	162,319,732
2014	98,466,397	75,086,321	173,552,719
2015	108,387,326	85,215,148	193,602,474
2016	117,350,169	97,589,186	214,939,355
2017	128,782,130	101,321,505	230,103,635
2018	136,846,804	108,921,028	245,767,832
2019	144,158,367	115,128,808	259,287,174
2020	118,938,230	94,906,635	213,844,865
2021	150,616,053	121,495,588	272,111,641
2022	150,850,631	121,381,906	272,232,537

එමෙන්ම, මහජනතාව දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා බෙදා හැරීම හා පාසැල් ළමුන්, පොලිස් නිලධාරීන්, රියදුරු සංගම්, මහජනතාව, ත්‍රිවිධ හමුදා නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් කිරීම සිදු කරන ලදී.













2.6 මාර්ග ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්ට අමතරව මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා බාහිර ආයතන සමඟ ඒකාබද්ධව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව මේ වන විට ප්‍රධාන නියමු ව්‍යාපෘති කිහිපයක් පවත්වා ගෙන යනු ලබයි. එනම්,

- රථ වාහන පාලනය හා මාර්ග ආරක්ෂාව සඳහා කළමනාකරණ පාඨමාලා පැවැත්වීම.
- ධාවනයට නුසුදුසු වාහන සම්බන්ධව පරීක්ෂා කර එම වාහන මාර්ග වලින් ඉවත් කිරීම සම්බන්ධ කාර්යයන්හිදී සම්පත් දායකත්වය ලබාදීම.
- තහනම් නියෝග නිකුත් කිරීම.
- මාර්ග ආරක්ෂාව පිළිබඳව ජාතික සභාව මඟින් පවත්වනු ලබන පාඨමාලා මෙහෙයවීම හා සම්පත් දායකත්වය ලබාදීම.
- රියදුරු පාසල් අධීක්ෂණය කිරීම





ධාවනයට නුසුදුසු වාහන සම්බන්ධව පරීක්ෂා කිරීම

ඉදිරි දැක්ම

- E - motoring ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා ඊට සමගාමීව හම්බන්තොට හා කොළඹ වරාය ආශ්‍රිතව කාර්යාල ස්ථාපිත කිරීම

- මේ දක්වා රියදුරු බලපත්‍ර ලබාදීම සම්බන්ධ මාර්ගගත සේවාව (On Line) නොමැති සියලුම දිස්ත්‍රික් කාර්යාල සඳහා මාර්ගගත පහසුකම (On Line) ලබාදීම

- ඉදිරියේ දී ජාතික ගොඩනාගිලි හා පර්යේෂණ ආයතනය, මධ්‍යම පරිසර ආධිකාරිය යන ආයතන හා ඒකාබද්ධව ලංකාවේ වායු තත්වය පිළිබඳ මහජනතාව දිනපතා මාධ්‍ය මඟින් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

- දෛනිකව මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සියලුම පරීක්ෂණ මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම ද සිදු කරනු ලබයි.

03 පරිච්ඡේදය

2022 දෙසැම්බර් මස 31 දිනේ අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අයවැය 2022		සටහන	තත්‍ය (රු.)		එස්සීඒ-එෆ්
			2022	2021	
-	ආදායම් ලැබීම්				
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	3	1,373,786,447.08	1,290,892,488	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	6,554,422,135.77	6,418,218,854	එස්සීඒ-1
-	මුළු ආදායම් ලැබීම් (අ)		**7,928,208,583**	**7,709,111,342**	
-	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම				එස්සීඒ-3
-	තැන්පතු		542,617,453	930,784,605	එස්සීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		45,249,054	47,945,318	එස්සීඒ-5/5a
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**587,866,507**	**978,729,923**	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**8,516,075,090**	**8,687,841,265**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		**2,145,000,000**	**2,338,507,398**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**6,371,075,090**	**6,349,333,867**	

අයවැය 2022		සටහන		තත්‍ය (රු.)			එස්සීඒ-එෆ්
				2022		2021	
	අඩු කළා : වියදම්						
-	පුනරාවර්තන වියදම්						
-	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5		601,091,166		523,950,776	
-	අනෙකුත් භාණ්ඩ හා සේවා	6		720,496,008		682,339,525	එස්සීඒ-2
-	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7		7,797,300			(ii)
-	පොළී ගෙවීම්	8				7,362,095	
-	මුළු පුනරාවර්තන වියදම් (ඊ)			**1,329,384,474**		**1,213,652,395**	
	මූලධන වියදම්						
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10		8,900,338		17,024,907	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11		42,048,865		95,056,162	
-	හැකියා වර්ධනය	14		1,777,019		702,310	
-	වෙනත් මූලධන වියදම්	15		453,783,051		696,477,969	
-	මුළු මූලධන වියදම් (උ)			506,509,274		809,261,348	
	තැන්පතු ගෙවීම්			510,518,661		1,164,224,065	එස්සීඒ-4
	අත්තිකාරම් ගෙවීම්			44,255,240		41,915,420	එස්සීඒ-5/5a
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්						
	ප්‍රධාන ලෙජර් වියදම් (උෆ)			554,773,901		1,206,139,485	
	මුළු වියදම් එ = (ඊ+උ+උෆ)			2,390,667,650		3,229,053,227	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)			3,980,407,440		3,120,280,640	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය			3,980,407,440		3,120,280,640	එස්සීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය					**163,507,398**	එස්සීඒ-3
				0		0	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		තත්‍ය	
	සටහන	2022 (රු.)	2021 (රු.)
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	2,511,830,619	2,480,792,391
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5	122,640,513	123,634,327
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	163,507,398
මුළු වත්කම්		2,634,471,132	2,767,934,116
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		59,901,953	95,102,558
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,511,830,619	2,480,792,391
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	62,738,560	28,531,768
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	163,507,398
මුළු වගකීම්		2,634,471,132	2,767,934,116

පිටු අංක 07 සිට 28 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 29 සිට 37 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.



3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

එස්සීඒ - සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්ය	
	2022 (රු.)	**2021 (රු.)**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	38,466,219	65,121,629
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	3,343,247,007	3,719,045,008
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	150,060,680	319,781,642
අග්‍රිම ලැබීම්		
අත්තිකාරම් අයකර ගැනීම්	53,646,285	26,308,027
තැන්පතු ලැබීම්	539,170,866	927,135,224
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	4,124,591,056	5,057,391,530
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,282,910,505	1,181,753,772
සහනාධාර සහ මාරු කිරීම්	7,797,300	
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	2,954,799	
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	2,145,000,000	2,338,507,398
අත්තිකාරම් ගෙවීම්	44,594,389	20,329,262
තැන්පතු ගෙවීම්	508,000,303	1,162,032,983
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	3,991,257,296	4,702,623,415
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	133,333,760	354,768,115
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-

	තත්ය	
	2022 (රු.)	**2021 (රු.)**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	133,333,760	354,768,115
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	133,333,760	354,768,115
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(133,333,760)	(354,768,115)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	0	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උඅ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උඅ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	0	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	0	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	0	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

		ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
	දේශීය භාණ්ඩ හා සේවා මත බද්ද				
1003	බලපත්‍ර ගාස්තු හා වෙනත්				
1003.01.00	සුඛෝපභෝගී මෝටර් රථ වාහන බද්ද	1,000,000,000.00	600,000,000.00	1,331,926,747,50	221.99%
1003.02.00	පැවරුම් බද්ද				
1003.07.00	අනෙකුත් බලපත්‍ර ගාස්තු				
1003.07.04	මෝටර් රථ විකිණීම මත බදු	50,000,000.00	30,000,000.00	32,755,603,03	109.18%
1003.07.09	කාබන් බද්ද			9,104,096,55	
		1,050,000,000.00	**630,000,000.00**	**1,373,786,447.08**	331.17%
	බදු නොවන ආදායම				
2003.02.14	මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු සහ අනෙකුත්	7,500,000,000.00	5,500,000,000, 00	6,554,422,058,31	119.17%
2003.02.15	සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම යටතේ මෝටර් රථ පැවරීමේදී අයකරනු ලබන ලියාපදිංචි කිරීමේ ගාස්තු	3,000,000.00	100.00	77.46	77.46%
	අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද ආදායම (අා)				
	මුළු බදු නොවන ආදායම (අ) + (අා)	7,503,000,000.00	5,500,000,100.00	6,554,422,135,77	119.17%
	මුළු ආදායම	**8,553,000,000.00**	**6,130,000,100.00**	**7,928,208,582.25**	**129.33%**

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.)		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,765,000,000.00	1,585,000,000.00	1,329,384,474.00	84%
ප්‍රාග්ධන	1,685,000,000.00	970,000,000.00	506,509,274.00	52%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන (රු.●)		තත්‍ය වියදම (රු.●)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	රියදුරු බලපත්‍ර මුද්‍රණය	950,000,000.00	900,000,000.00	453,783,051.00	50%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	224,522,742.83	224,522,742.83		100%
9152	යන්ත්‍රෝපකරණ	295,772,260.72	295,772,260,72		100%
9153	ඉඩම්	1,667,290,000.00	1,667,290,000.00		100%
9154	අස්පෘශ්‍ය වත්කම්	17,092,457,93	17,092,457,93,		100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්				100%
9160	කෙරීගෙන යන වැඩ ගොඩනැගිලි	273,453,157.10	273,453,157.10		100%
9180	කල් බදු වත්කම්	33,700,000.00	33,700,000.00		100%

3.9 විගණකාධිපති වාර්තාව

ඇමුණුම 1 සඳහන් පරිදි.

04 පරිච්ඡේදය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව වැඩසටහන් ගණනාවක් හඳුනා ගෙන තිබූ අතර එම එක්, එක් ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහත සටහනින් දැක්වේ.

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
භෞතික සම්පත් සංවර්ධනය යටතේ ඉදිකිරීම් හා අලුත්වැඩියාවන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය	99.03%		
ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම යටතේ දෘඪාංග හා මෘදුකාංග අත්පත්කර ගැනීමේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය	100%		
මානව සම්පත් සංවර්ධනය සඳහා සිදුකර ඇති වැඩසටහන් ගණන හා එහි මූල්‍ය ප්‍රගතිය	100%		
මූලධන ආයෝජන යටතේ රියදුරු බලපත්‍ර නිකුත්කර ඇති ප්‍රමාණය සහ ඒ සඳහා කර ඇති වියදම			50%

- රජයේ දෙපාර්තමේන්තු අතර ඉතා ඈත අතීතයකට හිමිකම් කියන මෙම දෙපාර්තමේන්තුව නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය, වේරහැර කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල පද්ධතියකින් සන්නද්ධව කටයුතු කරයි. මෙම දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි බොහෝමයක්ම ඉපැරණි බව නිසාම වරින්වර අලුත්වැඩියාවන්ට ලක් කළ යුතු මට්ටමේ පවතින අතර, ඒ නිසාම අත්‍යවශ්‍ය ඉදිකිරීම් හා අලුත්වැඩියාවන්ට වැඩි ප්‍රමුඛතාවක් ලබාදීමට සිදුව තිබේ. ඒ අනුව පසුගිය වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ මේ සඳහා ප්‍රමුඛතාවය යොමු වූ අතර, රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත එම කටයුතු සිදු කිරීමට නොහැකි විය.

- අප දෙපාර්තමේන්තුව"Äශ්‍රේණියේ" දෙපාර්තමේන්තුවක් වශයෙන් වාර්ෂිකව විශාල වැඩ ධාරිතාවක් සිදු කරනු ලබන ආයතනයකි. මෝටර් රථ ලියාපදිංචිය හා රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාළ මෙම සේවාවන් සඳහා යොමු වන සුවිශාල සේවාලාභීන්ට සාපේක්ෂව ඔවුන් සඳහා අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ මිල දී ගැනීම හා අලුත්වැඩියාව වෙනුවෙන් විශේෂ අවධානයක් යොමු කිරීමට අප දෙපාර්තමේන්තුවට සිදුවේ. මීට අමතරව උසස් මට්ටමේ සේවාවක් සැපයීම සඳහා මෘදුකාංග සංවර්ධනය කිරීම සඳහා දීර්ඝ කාලීන ව්‍යාපෘති කිහිපයක් බාහිර සේවා සැපයුම් ආයතන සමඟ අප දෙපාර්තමේන්තුව සිදු කරයි.

- දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් විශ්ලේෂණය කර බැලීමේදී දෙපාර්තමේන්තුගත අභ්‍යන්තර කාර්ය මණ්ඩලයත් ඒකාබද්ධ සේවය ඇතුළු අනෙකුත් සේවාවන් හරහා අනුයුක්ත කාර්ය මණ්ඩලයත් නිරන්තර පුහුණුව හා සංවර්ධනය තුළින් අභිප්‍රේරණය කිරීම සේවා සැපයුම්වල ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා ඉතා වැදගත් බව හඳුනාගෙන ඇත. මෙම වසරේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු නොකරන ලදී.

- දෙපාර්තමේන්තුව මගින් සේවා සැපයුම් වර්ධනය කර ගැනීම සඳහා බාහිර ආයතන ගණනාවක් සමග ගිවිසුම්ගතව කටයුතු කරන අතර රියදුරු බලපත්‍ර මුද්‍රණය, අංක තහඩු මුද්‍රණය වැනි කාර්යයන් මේ අතර ප්‍රධාන වේ. එමගින් අත්පත් කර ගෙන ඇති ප්‍රගතිය ප්‍රශස්ත මට්ටමක පවතී.

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්කය සපුරා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
නිරෝගි ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම 2030 වන විට මහාමාර්ගවල අනතුරුවලින් සිදු වන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම.	මාර්ගවල ධාවනය කරන රථ වාහනවල ප්‍රමිතිය පවත්වාගෙන යාම සඳහා ● වාහන ආනයනයේදී ප්‍රමිතියට අනුකූල වාහන පමණක් ලියාපදිංචි කිරීම ● මාර්ගවල ධාවනයේදී හදිසි පරීක්ෂා කිරීම් සිදු කිරීම රථ වාහන ධාවනය සඳහා රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේදී ● න්‍යායාත්මක දැනුම හා ප්‍රායෝගික පුහුණුව පරීක්ෂා කර රියදුරු බලපත්‍ර නිකුත් කිරීම ● රියදුරු බලපත්‍ර අළුත් කිරීමේදී ශාරීරික යෝග්‍යතාවය නැවත සලකා බැලීම ● රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේදී වයස් සීමාවන් සලකා බැලීම ● ආබාධිතයින් විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා විශේෂිත ක්‍රමවේදයක් අනුගමනය කිරීම ● පොදු මගී ප්‍රවාහනය සඳහා විශේෂ සටහනක් සහිතව රියදුරු බලපත්‍ර නිකුත් කිරීම ● රියදුරන් සඳහා අවාසි සහගත ලකුණු ලබා දීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම	වාර්ෂිකව රිය අනතුරු වලින් සිදු වන තුවාල වීම් හා මරණ සංඛ්‍යාවේ ප්‍රතිශතාත්මක වෙනස			✓ ✓ ✓ ✓ ✓ ✓
2030 වන විට රසායනික, වාතය, ජලය සහ පස දූෂණය වීමත් අපිරිසිදු වීම නිසා ඇතිවන මරණ සහ රෝගි තත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම.	● වාහන වලින් පිටවන විෂ දුම් පාලනය කිරීම සඳහා රථ වාහනවල වායු විමෝචන පරීක්ෂාවන් සිදු කිරීම	වාහනවලින් විෂ දුම් නිකුත් වීම සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලිවල අඩුවැඩි වීම			✓

ඉලක්කය / අරමුණ	ඉලක්කය සපුරා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
2030 වන විට ජල දූෂණය අඩු කරමින් ජලය ගුණාත්මක භාවය ඉහල නැංවීම සඳහා විෂ රසායනික ද්‍රව්‍ය හා වෙනත් ද්‍රව්‍ය බැහැර කිරීම අඩු කිරීම. 2030 වන විට වාතය ගුණාත්මක භාවය කළමනාකරණය තුළින් අහිතකර පරිසර බලපෑම අඩු කිරීම 2030 වන විට එකඟතාවයට පත්ව ඇති අන්තර්ජාතික වැඩ සැලැස්මට අනුව පරිසර හිතකාමී අන්දමින් රසායන ද්‍රව්‍ය හා අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම	• ගරාජ් ලියාපදිංචි කිරීමේදී නිසි පරිදි අපජලය හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදයන් පරීක්ෂා කිරීම • ශබ්ද දූෂණය වැලැක්වීම සඳහා නලා, ශබ්ද වාහිනි යන්ත්‍ර වාදනය කිරීමේ ප්‍රමිතිය පරීක්ෂා කිරීම	ගරාජ් ලියාපදිංචි කිරීමේදී පිරිපහදු නොකළ අපජලය ජල මූලාශ්‍රවලට මුදා හැරීම සම්බන්ධයෙන් වන පැමිණිලි සංඛ්‍යාවේ අඩුවැඩි වීම ශබ්ද දූෂණය සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලිවල අඩුවැඩි වීම			✓ ✓
පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා සැමට ජීවිත කාලය පුරා ඉගෙනීම සැලසීම	• එක් එක් වාහන පංති හඳුන්වා දෙමින් ඒ සඳහා පුහුණුව ලබා දිය හැකි ආයතන ශ්‍රේණි ගත කිරීම හා නියාමනය	රියදුරු පාසල් නියාමනය කිරීමේදී වාර්තා වන ගැටළු හා අඩුපාඩුවල සංඛ්‍යාත්මක අඩුවැඩි වීම			✓

ඉලක්කය / අරමුණ	ඉලක්කය සපුරා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව ඉහල නැංවීම 2030 වන විට අධ්‍යාපනය නොලබන පුහුණුවක් නොලබන රැකියාවක් නොමැති යෞවනයින්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් අඩු කිරීම	ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ හරහා රියදුරු බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදයක් පවත්වාගෙන යාම හා ඒ සඳහා වයස අවුරුදු 18 ට වැඩි පුරවැසියන්ට අවස්ථාව ලබා දීම				✓
තිරසර සංවර්ධනය සඳහා ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම. සියලුම ආකාරයේ අල්ලස හා දූෂණය කැපී පෙනෙන ලෙස අඩු කිරීම ඵලදායී විනිවිධ භාවයෙන් යුත් ආයතන පිහිටුවීම	අල්ලස හා දූෂණය අවම කිරීම සඳහා නවීන තොරතුරු තාක්ෂණික ක්‍රම කෙරෙහි වැඩි වශයෙන් නැඹුරුව සේවා සැපයීම ● අල්ලස හා දූෂණයට එරෙහිව ක්‍රියා කිරීමට ආයතනය තුළ දැනුවත් කිරීම් සිදු කර තිබීම හා පැමිණිලි කිරීමට පහසුකම් සපයා තිබීම. ● තොරතුරු නිලධාරීන් හරහා මහජනතාව වෙත අවශ්‍ය තොරතුරු සැපයීමට ක්‍රමවේදයක් සකස් කිරීම.	අල්ලස් හා දූෂණ චෝදනා සම්බන්ධයෙන් සනාථ වන චෝදනා සංඛ්‍යාවේ අඩුවැඩි වීම			✓ ✓

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අප දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගෙන ඇති තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමෙහිලා බාධා වන කරුණු ගණනාවක් පහත පරිදි හඳුනා ගත හැකිය.

අනු. අංකය	ඉලක්කය	ඉලක්ක සපුරා ගැනීමට බාධා වන කරුණු
1.	2030 වන විට මහාමාර්ග වල අනතුරු වලින් සිදු වන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම.	වාහනවල තත්ත්ව නියාමනය කිරීම සඳහා සිදු කෙරෙන හදිසි පරීක්ෂා කිරීම් ප්‍රමාණය මානව හා භෞතික සම්පත්වල පවත්නා ඌනතාවයන් හේතුවෙන් අවම වී ඇත. මාර්ග පද්ධතියේ පවත්නා ඌන සංවර්ධිත තත්ත්වයන් වාහනවල නියමිත තත්ත්වයෙන් පවත්වා ගෙන යාමට බාධාකාරී වේ. රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රායෝගික පරීක්ෂණවල ප්‍රමිතිය මැන බැලීම සඳහා නවීන තාක්ෂණික ක්‍රමවේදයන් ප්‍රමාණාත්මකව හඳුන්වා දී නොතිබීම. රියදුරන් සඳහා අඛණ්ඩ විධිමත් පුහුණු පාඨමාලාවන් මෙතෙක් සැලසුම් නොවීම. රියදුරන් සඳහා අවාසිදායක ලකුණු ලබා දීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය ආයතන ගණනාවක් හා ඒකාබද්ධව පවතින බැවින් තවදුරටත් සක්‍රීය නොවීම.
2.	2030 වන විට රසායනික, වාතය, ජලය සහ පස දූෂණය වීමත් අපිරිසිදු වීම නිසා ඇතිවන මරණ සහ රෝගී තත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම.	ව්‍යාජ ක්‍රමවේද හරහා දුම් පරීක්ෂණය සමත් වීමට ඇති පෙළඹවීම. ගරාජ ලියාපදිංචි කිරීමෙන් පසු සුපරීක්ෂණය සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම. පොදු මහජනතාව මෙම ක්ෂේත්‍රයන්හි හඳුනා ගනු ලබන ගැටළු, ඒ සඳහා වගකීම දරණ ආයතන වෙත පැමිණිලි කිරීමට මැලි වීම.
3.	පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා සැමට ජීවිත කාලය පුරා ඉගෙනීම සැලසීම	රියදුරු පුහුණුව ලබන පුහුණුලාභීන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක පුහුණු වීමක් රහිතව රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමට උත්සාහ කිරීම.
4.	තිරසර සංවර්ධනය සඳහා ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.	සේවකයින් හා සේවාලාභීන් අතර පවත්නා අයහපත් ආකල්ප හේතුවෙන් අල්ලස් හා දූෂණ වලට පෙළඹී කටයුතු කිරීම.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත) **
ජ්‍යෙෂ්ඨ	31	30	01
තෘතියික	21	02	19
ද්විතියික	823	758	65
ප්‍රාථමික	138	116	22

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ඇත්තේ කෙසේද

✓ දෙපාර්තමේන්තුව තුළ පවත්නා ආයතනවල නඩත්තු කටයුතු පවත්වා ගෙන යාම සඳහා තාක්ෂණික දැනුම සහිත නිලධාරීන් අනුයුක්ත නොවීම හේතුවෙන් අත්‍යවශ්‍ය රාජකාරීමය කටයුතු වලදී පවා බාධාවන් එල්ල වේ. උදාහරණ වශයෙන් ඇස්තමේන්තු සකස් කර ගැනීම සඳහා කාර්මික නිලධාරියෙකු නොවීම, යන්ත්‍ර හෝ යන්ත්‍රෝපකරණ වල සුළු අළුත්වැඩියාවන් සිදු කර ගැනීමට ප්‍රමාණාත්මක දැනුමක් සහිත නිලධාරීන් අනුයුක්ත නොවීම සඳහන් කළ හැකිය.

✓ අප දෙපාර්තමේන්තුව මඟින් සපයන කාර්මික සේවාවන් සැපයීම සඳහා මෝටර් රථ පරීක්ෂකවරුන්ගේ පුරප්පාඩු හේතුවෙන් බාධා මතුවීම.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම / ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය (10000x2)	02	දින 02	20,000.00		දේශීය	90%
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය (1000x1)	01	දින 01	10,000.00		දේශීය	90 %
Certificate in English for Office Management - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය (25000x2)	04	මාස 03	100,000.00		දේශීය	95%
මාර්ග ආරක්ෂණය පිළිබඳ පුහුණු වැඩමුළු	100	දින 03	200,000.00		දේශීය	95%
ඉදිරිපත් කිරීමේ කුසලතා සංවර්ධනය	100	දින 02	83,985.00		දේශීය	95%
ISO 9001(2015 QMS වැඩමුළුව	30	දින 01	328,536.00		දේශීය	95%
ISO 9001(2015 QMS වැඩමුළුව	01	දින 05	86,400.00		දේශීය	95%
Tamil Course (First Day)	123	පැය 150	317,980.00		දේශීය	95%
ඉදිරිපත් කිරීමේ කුසලතා	100	දින 01	545,207.17		දේශීය	95%

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01.0	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ		
01.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	
01.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	
01.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල වේ	
01.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ	
01.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ	
01.6	වෙනත්	අනුකූල වේ	
02.0	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)		
02.1	රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ	
02.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ	
02.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ	
02.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ	
02.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	
02.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ	
02.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ	
02.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ	
02.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ	

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
02.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ	
02.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ	
03.0	මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)		
03.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ	
03.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	
03.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ	
03.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	
04.0	වාර්ෂික සැලසුම් සකස් කිරීම		
04.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	
04.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	
04.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම		
04.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	
04.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
05.0	විගණන විමසුම්		
05.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	ඊ-මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මඟින් ඉදිරියේදී මෙවැනි ගැටළු තත්ත්වයන් මඟ හරවා ගත හැකිය.
06.0	අභ්‍යන්තර විගණනය		
06.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	
06.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	නිලධාරීන් දැනුවත් කර ඇත.
06.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	
06.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	
07.0	විගණන කළමනාකරණ කමිටු		
07.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ගය තුළ පවත්වා ගෙන තිබීම	අනුකූල වේ	

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
08.0	වත්කම් කළමනාකරණය		
08.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	
08.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල නොවේ	නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කරමි.
08.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	
08.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල නොවේ	නිලධාරීන් දැනුවත් කර ඇත.
08.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ	නිලධාරීන් දැනුවත් කර ඇත.
09.0	වාහන කළමනාකරණය		
09.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	
09.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ	
09.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	
09.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
09.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	
09.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	
10.0	බැංකු ගිණුම් කළමනාකරණය		
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ	
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	බැංකු ප්‍රකාශන විධිමත්ව ඉදිරිපත් කරන ලෙස බැංකුවට උපදෙස් දී ඇත.
11.0	ප්‍රතිපාදන උපයෝජනය		
11.1	සලසා තිබූ ප්‍රතිපදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන පද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල නොවේ	ඉදිරියේදී වළක්වා ගැනීමට කටයුතු යොදා ඇත.
12.0	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්		
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ	
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල නොවේ	නිලධාරීන් දැනුවත් කර ඇත.
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	භාණ්ඩාගාරයේ උපදෙස් ගැනීමට අපේක්ෂා කරමි.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
13.0	පොදු තැන්පත් ගිණුම		
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ	
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	
14.0	අග්‍රිම ගිණුම		
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	
15.0	ආදායම් ගිණුම		
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ	
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	
16.0	මානව සම්පත් කළමනාකරණය		
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ	
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ	
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.0	මහජනයා වෙත තොරතුරු ලබා දීම		
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	
18.0	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම		
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ	
19.0	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම		
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ	

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරණ ක්‍රියාමාර්ග
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ	
20.0	විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම		
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල නොවේ	ඉදිරියේදී එම අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කිරීමට අපේක්ෂා කරමි.

ඇමුණුම 1

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } PUR/C/DMT/2023/10 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 31 දින

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව.

ශීර්ෂය 307 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 307 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව පසුව ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් දිනට 31 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් මහජනයා වෙත ලබා දෙන සේවාවන් සඳහා එක් එක් ආදායම් සංකේත යටතේ දෛනිකව ලැබිය යුතු ආදායම නිවැරදිව එකතු වන බව

තහවුරු කර ගැනීම සඳහා ලබා දෙන සේවාවන් අනුව ආදායම හා ලද ආදායම සැසඳීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබීම හේතුවෙන් සපයන සේවාවන් හා සබැඳිව අයවිය යුතු ආදායම නිසි ලෙස ගිණුම් ගත වී ඇති බව තහවුරු කර ගැනීමකින් තොරව රු.3,579,179,220ක ලද ආදායම ගිණුම් ගත කර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල මඟින් සපයන සේවාවන් සඳහා අය කරනු ලබන ආදායම් සිගාස් පරිගණක පද්ධතිය මගින් දෙපාර්තමේන්තු ශීර්ෂය වෙත බැර කර ඇති අතර එලෙස බැර කර ඇති ආදායම තහවුරු කර ගැනීම සඳහා දිස්ත්‍රික් කාර්යාල වෙතින් විස්තරාත්මක ආදායම් වාර්තා ලබාගෙන නොතිබුණි. ඒ අනුව දිස්ත්‍රික් කාර්යාල වෙතින් ලැබී ඇති රු.4,620,125,055ක ආදායම නිවැරදි බව තහවුරු කර ගැනීමකින් තොරව අවසන් ගිණුම් පිළියෙල කර තිබුණි.

(ඇ) දිස්ත්‍රික් කාර්යාල මඟින් දෙපාර්තමේන්තු ශීර්ෂය වෙත ආදායම් බැර කිරීමට භාවිතා කරන ලද ශීර්ෂයන් භාවිතා කොට අවස්ථා කිහිපයකදී ආදායම් ශීර්ෂ 2කට එකතු වටිනාකම රු.3,872,839ක් හර කර ආදායම නැවත ලබා ගෙන තිබූ නමුත් එකී හර කිරීම්වලට හේතු වූ කරුණු හා එම හර කිරීම් දෙපාර්තමේන්තුවට අදාල වන ආකාරය තහවුරු කිරීමට උපයෝගී ලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තු ගිණුම් පොත් සහ වාර්තා පරීක්ෂා කිරීමේදී, සමාලෝචිත වර්ෂය සඳහා එක් එක් ආදායම් සංකේතය යටතේ අදාළ දෙපාර්තමේන්තුව විසින් රැස් කිරීම් හා අදාළ දෙපාර්තමේන්තුව වෙනුවෙන් වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් රැස් කළ ආදායම් සහ මූල්‍ය ප්‍රකාශ යටතේ දක්වා ඇති ආදායම් අතර පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

දෙපාර්තමේන්තුව විසින් රැස් කිරීම්,

ආදායම් සංකේතය	දෙපාර්තමේන්තු පොත් අනුව දෙපාර්තමේන්තුව විසින් රැස් කිරීම් (ආදායමෙන් ආපසු ගෙවීම් අඩු කිරීමට පෙර)	මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති දෙපාර්තමේන්තුව විසින් රැස් කිරීම්	වෙනස
	(රු.)	(රු.)	(රු.)
1003.07.04	32,997,000	29,364,000	3,633,000
2003.02.14	3,403,706,129	3,089,870,505	313,835,624
2003.02.15	77	71	6

දෙපාර්තමේන්තුව වෙනුවෙන් වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු විසින් රැස් කිරීම් (ආපසු ගෙවීම් අඩු කිරීමට පෙර)

ආදායම් සංකේතය	මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු විසින් රැස් කිරීම් (රු.)	දෙපාර්තමේන්තු පොත් අනුව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු විසින් රැස් කිරීම් (රු.)	වෙනස (රු.)
1003.07.04	3,745,250	112,250	3,633,000
2003.02.14	3,535,291,834	3,220,182,799	315,109,035
2003.02.15	6	-	6

(ඉ) මු.රෙ (2) (ඇ) මු.රෙ 176 (1) සහ අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය අනුව එක් එක් ආදායම් සංකේතය යටතේ හිඟ ආදායම් ගණනය කොට මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු නමුත් 1003-07-09 දරණ ආදායම් සංකේතය යටතේ පසුගිය වර්ෂය වෙනුවෙන් හිඟ ආදායම් ගිණුම් ගත කර නොතිබුණි. එහෙත් ප්‍රවර්තන වර්ෂයේදී උක්ත ආදායම් සංකේතය යටතේ රු.9,105,861ක් හිඟ ආදායම් අය කර ගෙන තිබුණි. ඒ අනුව ප්‍රවර්තන වර්ෂයේදී ද උක්ත ආදායම් සංකේතය යටතේ හිඟ ආදායම් පැවතිය හැකි බැවින් හිඟ ආදායම් නිවැරදිව ගණනය වී නොමැති බව නිරීක්ෂණය විය.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයෙහි (ඒසීඒ - 1 (1)) සඳහන් වර්ෂ අවසාන හිඟ ආදායම රු.164,964,500ක් වුවත් හිඟ ආදායම් සම්බන්ධයෙන් සකස් කර ඇති උපලේඛන අනුව හිඟ ආදායම රු.170,942,000ක් වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල හිඟ ආදායම රු.5,977,500ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සුඛෝපභෝගී බද්ද අදාල වන වාහනයක් මුල් ලියාපදිංචිය සිදු වූ දින සිට වසර 7ක් යන තෙක් වාර්ෂිකව සුඛෝපභෝගී බදු ගෙවිය යුතු වේ. ඒ අනුව සුඛෝපභෝගී බද්දට යටත් වාහන සඳහා ඉදිරි වසර 6ක් යන තෙක් සුඛෝපභෝගී බද්දට අදාල වාර්තා පවත්වාගෙන යා යුතු වුවත් එලෙස සුඛෝපභෝගී බද්දට යටත් වාහන සංඛ්‍යාව හා එක් එක් වාහනය වෙනුවෙන් අය වී ඇති බද්ද හා තවදුරටත් අයවිය යුතු හිඟ බද්ද ඇතුලත් උපලේඛන පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් රු.164,964,500ක හිඟ සුඛෝපභෝගී බදු ආදායමෙහි නිවැරදිතාවය තහවුරු නොකෙරුණි.

1.6.2 පුනරාවර්තන වියදම්

මූල්‍ය කල්බදු ක්‍රමයට මිල දී ගෙන ඇති මෝටර් රථ තුනකට අදාළව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාග්ධන වටිනාකම ලෙස රු.6,561,537ක් හා පොලී වියදම ලෙස රු.1,690,427ක් ගෙවීම් කර ඇතත් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි වැය විෂය අංක 2108 යටතේ මූල්‍යන වත්කම් අත්පත් කර ගැනීම් ලෙස රු.5,999,900ක් හා වැය විෂය අංක 1406 යටතේ කල් බදු වාහන සඳහා පොලී වියදම ලෙස රු.1,766,444ක් ගිණුම් ගත කර තිබීම

හේතුවෙන් මූලධන වියදම් රු.561,637ක් අඩුවෙන් දක්වා තිබූ අතර කල්බදු පොලී වියදම් රු.76,017ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.3 මූලධන වත්කම්

මීගහ කිවුල ගොඩනැගිලි ඉදි කිරීම හා ස්පර්ෂක ක්‍රමය ඔස්සේ විභාග සිදු කිරීම (307-2-1-10-2104) යන වැය විෂය වෙනුවෙන් ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන මුදල රු.15,000,000 වන නමුත් එකී වැය විෂය යටතේ රු.15,225,737 වියදම් දරා තිබුණි. ප්‍රතිපාදන ඉක්මවා වැය දරා ඇති බව මූල්‍ය ප්‍රකාශන තුලින් හෙලිදරව් වීම වැලැක්වීම සඳහා රු.225,737ක ඉක්මවීම් එම වැය ශීර්ෂයට මුදලින් කල වියදම් ලෙස සෘණ අගයක් ඇතුලත් කර ගොඩනැගිලි ඉදිකිරීම් (307-2-1-12-2104) වැය විෂයට එකතු කර තිබුණි.

1.6.4. අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

(අ) මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ඒ.සී.ඒ.1 ආකෘතිය තුළ (එස්.ඒ.21 අනුව) වෙනත් දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශය විසින් රැස් කරන ලද ආදායම රු.4,410,501,640ක් ලෙස දක්වා ඇති නමුත් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය (ඒ.සී.ඒ.7 ආකෘතිය) තුළ වෙනත් ආයතන විසින් වාර්තා කරන ආයතනය වෙනුවෙන් රැස්කර ඇති ආදායම ලෙස රු.4,532,783,778ක් ඇතුළත් කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ආකෘති දෙකක් අතර ආදායම සම්බන්ධයෙන් රු.122,282,138ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ එස්.ඒ.30 හා ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි ඇතුලත් අගයන් අනුව අනෙකුත් ශීර්ෂ විසින් තැන්පත් ගිණුමට සිදු කරන ලද හර කිරීම් හා බැර කිරීම් පිළිවෙලින් රු.2,521,957ක් හා රු.3,450,137ක් වුවත් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුල අනෙකුත් ශීර්ෂ තැන්පත් ගිණුමට සිදු කල හර කිරීම් හා බැර කිරීම් පිළිවෙලින් රු.2,518,357ක් හා රු.3,446,587ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් මුළු හර කිරීම් රු.3,600ක් හා මුළු බැර කිරීම් රු.3,550ක් අඩුවෙන් සටහන් කර තිබීම හේතුවෙන් අග්‍රිම සැසඳීම නිවැරදිව සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.

1.6.5 මූල්‍ය නොවන වත්කම්

(අ) මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා භාවිත නොකරන රියදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති වැය විෂය 307-02-01-0-2509 යටතේ රු.918,000ක් වටිනා පරිගණක උපාංග හා රු.6,511,960ක් වටිනා UPS බැටරි 96 ක් මිල දී ගෙන තිබූ අතර එකී වත්කම් පරිගණක උපාංග ලෙස ගිණුම් ගත නොකිරීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් රු.7,429,690ක් අඩුවෙන් දක්වා තිබිණි.

(ආ) මීගහ කිවුල ගොඩනැගිලි ඉදිකිරීම් හා ස්පර්ශක ක්‍රමය ඔස්සේ විභාග සිදු කිරීම යන වැය විෂය (307-2-1-10-2104) තුලින් වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ 8ක ශීර්ෂයන්

යටතේ ප්‍රවර්තන වර්ෂය තුල රු.15,225,737ක ප්‍රාග්ධන වියදම් දරා මෝටර් රථ දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්යාල වෙත ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගෙන ඇති නමුත් එකී වත්කම් මූල්‍ය නොවන වත්කම් තුල ඇතුලත් නොකිරීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.6 තැන්පතු ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආපසු ගෙවීමේ පදනම මත රඳවාගන්නා ලද රැඳවුම් මුදල්, කොන්ත්‍රාත්තුව හෝ අපේක්ෂිත කාර්යය ඉටුවූ වහාම එකී රැඳවුම් මුදල් නිදහස්කර ගන්නා ලෙස තැන්පත්කල ආයතන/ පුද්ගලයින් වෙත දන්වා යැවිය යුතු අතර එලෙස කිහිපවතාවක් දන්වා යැවීමෙන් පසු හිමිකම්පෑමට කිසිවකු ඉදිරිපත් නොවන්නේ නම් පමණක් වසර 2ක් ගතවූ පසු මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව රජයේ ආදායමට බැර කල යුතුවේ. එහෙත් තැන්පතු හිමියන් වෙත එවැනි විධිමත් දැනුම් දීමකින් තොරව 2022 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුම් 3කට අදාළව එකතු වටිනාකම රු.14,816,930ක තැන්පතු රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර තිබුණි.

(ආ) දිස්ත්‍රික් කාර්යාලවල පවත්වාගෙන යන තැන්පතු ගිණුම් 3කට අදාළව රු.7,764,236ක තැන්පතු ශේෂයක් විසර්ජන ගිණුමට ඇතුළත්කර ඇති නමුත් ඊට අදාල කාල විශ්ලේෂණයක් සහිත කේවල ශේෂ ලැයිස්තුවක් විගණනය වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම තැන්පතු ශේෂයෙහි නිවැරදිතාවය හා මුදල් රෙගුලාසි 571ට අනුකූලතාවය පරීක්ෂාකල නොහැකි විය.

(ඇ) ගිණුම් වර්ෂය තුල අනෙකුත් ශීර්ෂ විසින් තැන්පත් ගිණුමට රු.3,450,137ක් තැන්පත් කර තිබූ අතර රු.2,521,957ක තැන්පතු වර්ෂය තුල නිරවුල් කර තිබුණි. එහෙත් එකී තැන්පතු බැර කිරීම් හා තැන්පතු නිදහස් කිරීම් කවරේද යන්න තහවුරු කර ගැනීම සඳහා කිසිදු ලේඛනයක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

1.6.7 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සිගාස් පද්ධතිය මඟින් ලබාගත් ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමට හරස් සටහන් මඟින් සිදු කල බැර කිරීම් රු.21,668,415 හා හර කිරීම් රු.20,731,448ක් වූවත් සහතික කර විගණනයට ඉදිරිපත් කල රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම තුල මුළු බැර කිරීම් රු.13,271,184ක් හා හර කිරීම් රු.20,392,339ක් ලෙස ඇතුලත් කර තිබුණි. වෙනසට හේතුව වන දෙපාර්තමේන්තු ශීර්ෂයන්ට අයත් නොවන හර කිරීම් හා බැර කිරීම් ලැයිස්තුවක් විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් සහතික කල අත්තිකාරම් බී ගිණුමේ නිවැරදිතාවය තහවුරු නොවුණි.

(ආ) නිලධාරියා මිය ගොස් වර්ෂ 05කට වඩා කල්ගත වී ඇති රු.342,200ක ණය ශේෂ ඇපකරුවන්ගෙන් හෝ උරුමක්කරුවන්ගෙන් අයකර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මු.රෙ. 485 (4) හා මු.රෙ. 113 (6) (ආ) පරිදි ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ තුන් මසක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත්, ස්ථාන මාරු වී ගිය නමුත් නිරවුල් නොකළ වර්ෂ 05කට වඩා වැඩි ණය ශේෂයන්ගේ එකතුව රු.226,230ක් විය.

(ඈ) විශ්‍රාම වැටුප් අත්හිටවූ නිලධාරීන් 02 දෙනෙකුගෙන් අයවිය යුතු වූ රු.154,547ක ණය ශේෂය වර්ෂ 05කට වඩා පැරණි වූ අතර වර්ෂ 3-4 අතර කාලයට අයත් රු.176,565ක ණය ශේෂයක්ද විගණනයේදී නිරීක්ෂණය විය.

(ඉ) වැඩ තහනම් කළ නිලධාරීන් 15දෙනෙකුගෙන් අය විය යුතු රු.1,389,843ක ණය ශේෂ එම ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට 2022 දෙසැම්බර් 31 දින වන විටත් අපොහොසත් වී තිබුණි. වර්ෂ 05 ඉක්ම වූ එකතුව රු.1,140,463ක ණය ශේෂ 12ක්ද ඒ අතර විය.

(ඊ) අවසාන වාරිකය අය කර වර්ෂ 05කට වඩා කල්ගත වී තිබුණු සේවය අත්හැර ගිය නිලධාරියකුගෙන් අය විය යුතු රු.171,638ක ණය ශේෂයක් ද, වර්ෂ 3-4ත් අතර කාලයට අයත් රු.48,654ක ණය ශේෂයක්ද, අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(උ) විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂවල මාස 03ක සිට වර්ෂ 02 දක්වා කාලපරිච්ඡේදයක සිට පැවත එන එකතුව රු.1,780,861ක ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

1.6.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මෝටර් රථ තුනක් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ අත්පත් කර ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ආපසු ගෙවන ලද ණය මුදල රු.6,561,537ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයට එය රු.5,999,900ක් ලෙස දක්වා තිබීමෙන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.561,637කින් වැඩියෙන් දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරාවර්තන වැය විෂයන් 4ක් සඳහා අධි ප්‍රතිපාදන සලසාගෙන තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනයෙන් පසු රු.3,897,316ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. වැය විෂයන් අනුව උක්ත ප්‍රතිපාදන ඉතිරිවීම් සියයට 12 සිට සියයට 38 දක්වා වූ පරාසයක් ගෙන තිබුණි.

(ආ) මූලධන වැය විෂයන් සඳහා නිවැරදි පුරෝකථනයකින් තොරව ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් මූලධන වැය විෂයන් 6කට අදාලව ප්‍රතිපාදන උපයෝජනයෙන් පසු රු.463,234,733ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. වැය විෂයන් අනුව එකී ප්‍රතිපාදන ඉතිරිවීම් සියයට 11 සිට සියයට 91 දක්වා පරාසයක් ගෙන තිබුණි.

.(ඇ) නව ලියාපදිංචි වාහන අංක තහඩු (01-1409) වැය විෂය සඳහා අධි ප්‍රතිපාදන සලසා ගැනීම හා පුනරාවර්තන වැය විෂයන් 10කට අදාලව වියදම් නිසි ලෙස පුරෝකථනය නොකිරීම හේතුවෙන් වාහන අංක තහඩු වැය විෂයෙන් රු.64,443,275ක් උක්ත පුනරාවර්තන වැය විෂයන් වෙත මු.රෙ.66/69 ප්‍රකාරව මාරු කර තිබුණි.

(ඈ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පවතින දත්ත පද්ධතියෙහි ඇති දුර්වලතා ඉවත් කර අක්‍රමිකතා වලක්වා දත්ත පද්ධතිය ශක්තිමත් කිරීමේ අරමුණින් ප්‍රවර්ථන වර්ෂයේ රු.20,000,000ක ප්‍රතිපාදන සලසා දී ඇතත් එකී ප්‍රතිපාදන වලින් කිසිදු මුදලක් උපයෝජනය කර නොතිබුණු අතරම ඊ මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කිසිදු සාධනීය ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වී නොතිබුණි.

(ඉ) ගිවිසුම් ගත කල් බදු වාරිකය අනුව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාග්ධන වටිනාකම ලෙස රු.7,194,749ක් ගෙවිය යුතුව තිබිය දී අයවැය ඇස්තමේන්තු සැකසීමේ දී 2018 ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම වැය විෂය සඳහා රු.6,000,000ක් ඇස්තමේන්තු කර තිබීම හේතුවෙන් නිසි සැලකිල්ලකින් තොරව අයවැය ඇස්තමේන්තු සකස් කර ඇති බව නිරීක්ෂණය විය.

2.2 බැරකම් හා බැඳීම්වලට එළැඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර සමුච්චිත බැඳීම් හා බැරකම් පිළිබඳ වාර්තාවෙහි (SA 92) රු.804,745,378ක් බැඳීම් හා බැරකම් ඇතුළත් වී ඇතත් මුදල් රෙගුලාසි 94 (2) හා 3 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් බැරකම් පිළිබඳ ප්‍රකාශය තුල බැඳීම් හා බැරකම් අගය ලෙස රු.527,253,074ක් ඇතුලත් කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල බැඳීම් හා බැරකම් රු.277,492,304කින් අඩුවෙන් දක්වා තිබිණි.

(ආ) පූර්ව ගිණුම් වර්ෂයක් අවසන් දිනට බැඳීම් හා බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් වී නොතිබූ පසුගිය වර්ෂයට අදාල රු.6,295,777ක වියදම් සමාලෝචිත වර්ෂය තුල ගෙවා නිදහස් කර තිබුණි.

(ඇ) 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 02 (ආ) ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂ තුල ගෙවීමට ඇති බැඳීම් විසර්ජන ගිණුමේ සටහන 03 තුල හෙලිදරව් කළ යුතු වුව ද, 2022 දෙසැම්බර් 31 දිනෙන් පසු ඉදිරියට ගෙවීමට ඉතිරිව ඇති මූල්‍ය කල්බදු වාරික 17ක් වෙනුවෙන් වූ රු.12,756,239ක් බැඳීම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කර නොතිබුණි.

(ඇ) මූල්‍ය කල්බදු පදනම මත ලබාගත් වාහන 03කට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව නොගෙවා ඇති රු.750,367ක වාරික වටිනාකම වර්ෂය අවසාන දිනට බැරකම් ප්‍රකාශය තුල ඇතුලත් කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හෝ රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්
(අ) 2007 ජූලි 9 දිනැති 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතේ 5 වගන්තිය හා 6 (1) අ, ආ, ඇ, ඡේද	පරිගණකයට යම් කර්තව්‍යයක් ඉටු කිරීමට සැලැස්වීම සඳහා තමාට අධිකාරී බලයක් නොමැති බව දන්වමින්, හිතාමතා යම් පරිගණකයකට හෝ පරිගණක පද්ධතියකට අනවසර වෙනස්කමක් හෝ අලාභයක් සිදු කිරීමත්, එය ජාතික ආරක්ෂාවට, ජාතික ආර්ථිකයට හෝ මහජන ආරක්ෂාවට හානියක් සිදුකරන ඕනෑම තැනැත්තෙක් වරදකරුවකු වන බව දක්වා තිබුණත් දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය වෙනස් කරමින් නිරන්තරයෙන් වංචනික ක්‍රියා සිදු වන බවට අනාවරණය වුවත්, එම වංචා වළක්වා ගැනීමටත් අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.
(ආ) මු. රෙ. 770	වේරහැර උප කාර්යාලයේ බර සහතික නිකුත් කිරීමේ අංශයේ භාවිතයට ගත නොහැකි තත්ත්ව පරීක්ෂණ උපකරණ සමීක්ෂණ මණ්ඩලයක නිර්දේශ පරිදි ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) මු.රෙ. 342(5)	අවසන් වූ කුවිතාන්සි හෝ උපපත්‍රිකා පොත් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය දක්වා ඇතත් වේරහැර ප්‍රධාන සරප් කාර්යාලයේ භාවිතා කරන ලද පොදු 172 කුවිතාන්සි පොත් විශාල ප්‍රමාණයක් අවධිමත්ව ගොඩ ගසා තිබුණි.
(ඇ) මු. රෙ.104(3)	අනතුර සිදුවූ දිනයේ සිට දින 07ක් ඇතුළත අනතුරු

සම්බන්ධව ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වූවත් 2022 වර්ෂයේ සිදු වූ අනතුරු 04න් අනතුරු 02ක් සඳහා විගණිත දිනය වන 2023.05.19 වන විටත් ප්‍රාරම්භක වාර්තා නිකුත් කර නොතිබුණි.

(ඉ) මු.රෙ.104 (4) — අනතුරු සම්බන්ධව පූර්ණ වාර්තාවක් අනතුර සිදුවූ දිනයේ සිට මාස තුනක් ඇතුළත දී ඉදිරිපත් කළ යුතු වූවත් 2022 වර්ෂයේ සිදු වූ අනතුරු හතර සඳහාම පූර්ණ වාර්තා විගණිත දිනය වන 2023.05.19 වන විටත් නිකුත් කර නොතිබුණි.

(ඊ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 6.3.6 ඡේදය — මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන ලියාපදිංචිය සඳහා භාවිතා කෙරෙන වාහන ලියාපදිංචි ආකෘතිපත්‍ර මිලියනයක් මුද්‍රණය කිරීම සම්බන්ධ ප්‍රසම්පාදනයේදී ලංසු විවෘත කිරීමේ කමිටුව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් ආකෘතිය භාවිතයෙන් ලංසු විවෘත කිරීමේ සටහනක් සකස් කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලියාපදිංචි අංක KE -4103 යටතේ පූර්වයෙන් ලියාපදිංචිව පැවති CEYGRA වර්ගයට අයත් මෝටර් රථයක දත්ත සාවද්‍ය ලෙස වෙනස් කොට MITSUBISHI PAJERO වර්ගයේ මෝටර් රථයක දත්ත ඇතුලත් කර 2019 වර්ෂයේදී මෝටර් රථ ලියාපදිංචි සහතිකයක් වංචනිකව නිකුත් කිරීම හේතුවෙන් දඩ මුදල් ද ඇතුලුව රු.757,500ක සුඛෝපභෝගී බදු ආදායමක් හා රු.35,200,000ක නිෂ්පාදන බදු ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දත්ත පද්ධතිය අනුව KE – 3846 දරණ අංකය යටතේ CRYGRA වර්ගයට අයත් මෝටර් රථයක් ලියාපදිංචි වී ඇති නමුත් 2018 වර්ෂයේදී එකී දත්ත වෙනස් කර MINICOOPER වර්ගයේ මෝටර් රථයක දත්ත ඇතුලත් කර මෝටර් රථ ලියාපදිංචි සහතිකයක් නිකුත් කර තිබීම හේතුවෙන් රු.5,513,000ක නිෂ්පාදන බදු ආදායමක් හා රු.44,050ක නව ලියාපදිංචි ගාස්තුවක් අහිමි වී තිබුණි.

(ඇ) මෝටර් රථ ලියාපදිංචි තොරතුරු පද්ධතිය අනුව ලියාපදිංචි අංක KE – 4521 දරණ අංක යටතේ CEYGRA වර්ගයේ බර 580Kg පෙට්‍රල් මෝටර් රථයක් ලියාපදිංචි වී ඇතත් 2018 වර්ෂයේදී එකී දත්තයන් වෙනස් කොට TOYOTA වර්ගයේ බර 2580Kg ඩීසල් මෝටර් රථයක දත්ත ඇතුලත් කර ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම හේතුවෙන් රු.49,920,000ක නිෂ්පාදන බදු ආදායමක් අහිමි වී තිබුණි.

(ඈ) මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දත්ත පද්ධතියෙහි පූර්ව ලියාපදිංචි වැසි අංක හා එන්ජින් අංක වෙනස් කර අනීතිකව ආනයනය කරන ලද යතුරුපැදිවල වැසි අංක හා එන්ජින් අංක ඇතුළත් කර ලියාපදිංචි සහතික නිකුත්කර ඇති යතුරුපැදි 91ක එන්ජින් ධාරිතාවය සැලකිල්ලට ගත් කල වලංගු රේගු සටහන්කරයක් සහිතව ආනයනය නොකිරීම හේතුවෙන් රු.55,207,475ක රේගු බදු ආදායමක් රජයට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.

(ඉ) ලංකාවට අනීතිකව ආනයනය කරන ලද එහෙත් ලියාපදිංචි නොකළ යතුරුපැදි ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනලද අංක අමප/16/1307/709/061 හා 2016 ජූලි 05 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව හා 2016 සැප්තැම්බර් 07 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අදාළ අධිභාර මුදල් අයකර ගැනීමකින් තොරව වංචනිකව පැරණි අංක යටතේ ලියාපදිංචි සහතික නිකුත් කිරීම හේතුවෙන් වාහන 91කට අදාළව රු.21,285,000ක අධිභාර ගාස්තුවක් හා රු.191,000ක නව ලියාපදිංචි ගාස්තුවක් අයකර ගැනීමේ අවස්ථාව අහිමි වීමෙන් රු.21,476,000ක රජයට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.

3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෝටර් රථ පනත ප්‍රකාරව මෝටර් රථයක් සජ්ජිත කිරීමේදී වැසිය හැර අනෙකුත් උපාංග වෙනස් කල හැකි වුවත් පෙට්‍රල් වාහනයක් ඩීසල් වාහනයක් බවට පරිවර්තනය කිරීමේදී වැසි අංකයද වෙනස් කර තිබූ අවස්ථා 27ක් නිරීක්ෂණය වී ඇති අතර ඒ අනුව මෝටර් රථයක් සජ්ජිත කරන මුවාවෙන් අනීතිකව ආනයනය කරන ලද වාහන 27ක් ලියාපදිංචි කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) පෙට්‍රල් මෝටර් රථයක් ඩීසල් මෝටර් රථයක් බවට පරිවර්තනය කිරීමේදී පැරණි මෝටර් රථ ලියාපදිංචි අංකය පද්ධතියෙන් ඉවත් කල යුතු වුවත් අවස්ථා 130කදී පරිවර්තිත වාහනවල ලියාපදිංචි අංක පද්ධතියෙන් ඉවත්කර නොතිබුණි.

(ඇ) එන්ජින් අංකය හා වැසි අංකය යන දෙකම එකම අංකය ලෙස පරිගණක පද්ධතියට දත්ත ඇතුළත් කර පූර්වයෙන් ලියාපදිංචි වී තිබූ වාහන 03ක් සජ්ජිත කර වැසි අංක වෙනස් කර වෙනත් අනීතික වාහන 3ක් ලියාපදිංචි කර තිබුණි.

(ඈ) ලියාපදිංචි අංක BDA-7847 දරණ යතුරුපැදියේ හිමිකරුගේ අනුදැනුමකින් තොරව සොරකම් කරන ලද ලිපි ලේඛන භාවිතයෙන් වෙනත් පුද්ගලයන් දෙදෙනෙකු වෙත

පැවරුම් කර ඇති අතර එකී පැවරුම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ඉ) වේරහැර කාර්යාලයෙහි කන්ටේනර් පෙට්ටි 18ක් තුල වාහන ලියාපදිංචි මුල් ලිපි ගොනු හා පැවරුම් ලිපි ගොනු ගබඩා කර තිබූ අතර එකී කන්ටේනර් වැස්සෙන් ආරක්ෂා කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් කන්ටේනර් දිරාපත් වී ගබඩා කර තිබූ ලිපි ගොනු විනාශ වී තිබුණි.

(ඊ) වේරහැර ගබඩාව වෙත භාර දී ඇති මුල් ලිපිගොනු හා පැවරුම් ලිපිගොනු පහසුවෙන් නැවත ලබා ගත හැකි පරිදි ගබඩා කිරීමකින් තොරව ගබඩාවේ කොරිඩෝව තුල ගොඩ ගසා තිබුණි.

(උ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන ලියාපදිංචිය සඳහා භාවිතා කෙරෙන වාහන ලියාපදිංචි සහතික මිලියනයක් මුද්‍රනය කිරීම සම්බන්ධ ප්‍රසම්පාදනයේදී, ප්‍රසම්පාදන පත්‍රිකාවෙහි හැදින්වීම, පොදු උපදෙස් සහ කොන්දේසි යන මාතෘකාව තුළ ලංසු ප්‍රදාන ලිපියේ දින සිට සති තුනක් ඇතුළත මෝටර් රථ ලියාපදිංචි සහතික ආකෘතිපත්‍ර ලක්ෂයක් ලබාදිය යුතු බව සඳහන්ව ඇති අතර එම ප්‍රසම්පාදන පත්‍රිකාවෙහිම අන්තර්ගත එකඟතා ප්‍රකාශයෙහි ලංසු ප්‍රදාන ලිපියේ දින සිට දින 30ක් ඇතුළත මෝටර් රථ ලියාපදිංචි සහතික ආකෘති පත්‍ර ලක්ෂයක් ලබාදිය යුතු බව සඳහන්ව තිබීම හේතුවෙන් නිසි සැලකිල්ලකින් තොරව ලංසු ලේඛන පිළියෙලකර ඇතිබව නිරීක්ෂණය විය.

(ඌ) දීර්ඝ කාලයක් තිස්සේ ආදායම් බලපත්‍ර නිකුත් කර ඇති ලියාපදිංචි යතුරුපැදි 99කට අදාළ වැසි අංක හා එන්ජින් අංක වෙනස් කර වෙනත් වංචනිකව ආනයනය කරන ලද යතුරුපැදිවල එන්ජින් අංක හා වැසි අංක වංචනිකව ඇතුළත් කර උක්ත පැරණි ලියාපදිංචි අංකය සඳහා නව මෝටර් වාහන ලියාපදිංචි සහතිකයක් නිකුත් කර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියෙහි පැරණි දත්ත මකා දමා දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කටයුතු කර තිබුණි.

(එ) වෙනත් වාහන පංතියකට අදාළව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ඇති වාහන 31ක වැසි අංක හා එන්ජින් අංක වෙනස් කර වංචනිකව ආනයනය කරන ලද යතුරුපැදිවල එන්ජින් අංක හා වැසි අංක ඇතුළත් කර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය තුළ ඇතුළත්ව තිබූ පැරණි දත්ත පද්ධතියෙන් මකා දැමීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරීන් කටයුතු කර තිබුණි.

(ඒ) පූර්වයෙන් ආදායම් බලපත්‍ර නිකුත් කර ඇති වෙනත් වාහන පන්තියකට අදාලව ලියාපදිංචි වී ඇති වාහන 29කට අදාළ වැසි අංක හා එන්ජින් අංක වෙනස් කර වෙනත් නීත්‍යානුකූල නොවන ලෙස ආනයනය කරන ලද වාහන වල වැසි අංක හා එන්ජින් අංක ඇතුළත් කර පැරණි ලියාපදිංචි අංකය සඳහා මෝටර් රථ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීමට හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතියෙ හි උක්ත පැරණි ලියාපදිංචියට

අදාළ දත්ත මකා දැමීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරීන් කටයුතු කර තිබුණි.

(ඔ) පූර්ව ලියාපදිංචි මෝටර් කාර් 11ක වැසි අංක හා එන්ජින් අංක වෙනස් කර වෙනත් අනීතිකව ආනයනය කරන ලද හෝ එකලස් කරන ලද කාර් රථයක වැසි අංක හා එන්ජින් අංක ඇතුළත් කර වංචනිකව මෝටර් රථ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීමට හා පැරණි මෝටර් රථයට අදාළ දත්ත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතියෙන් මකා දැමීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරීන් කටයුතු කර තිබුණි.

(ඕ) දීර්ඝ කාලයක් තිස්සේ ආදායම් බලපත්‍ර ලබාගෙන නොමැති හිඟ ආදායම් බලපත්‍ර ගාස්තු සහිත ලියාපදිංචි යතුරුපැදි 04ක එන්ජින් අංකය හා වැසි අංකය වෙනස් කර වෙනත් අනීතිකව ආනයනය කරන ලද යතුරුපැදි 04ක එන්ජින් අංක හා වැසි අංක ඇතුළත් කර වංචනිකව 2022 වර්ෂයේ දී මෝටර් රථ ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කර තිබුණි.

(ක) අවලංගු කරන ලද විදේශීය රාජ්‍ය තාන්ත්‍රික වාහන අංක සඳහා වෙනත් වාහන ලියාපදිංචි කිරීම.

(i) විදේශීය රාජ්‍ය තාන්ත්‍රිකයන් හා රාජ්‍ය නොවන සංවිධාන වෙනුවෙන් ආනයනය කර රාජ්‍ය අනුග්‍රහය යටතේ තීරු බදු රහිතව නිෂ්කාශනය කොට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද පසුව එකී වාහන නැවත ප්‍රතිඅපනයනය කරන අවස්ථාවන්හි දී ලියාපදිංචි අවලංගු කරන ලද වාහන 06ක් සඳහා සාවද්‍ය ලෙස වෙනත් සුඛෝපභෝගී වාහනවල වැසි අංක හා එන්ජින් අංක ඇතුළත් කර වෙනත් පුද්ගලයෙකුගේ නමට ලියාපදිංචි සහතික නිකුත් කිරීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරීන් කටයුතු කර තිබුණි.

(ii) ශ්‍රී ලංකා රේගුවේ දත්ත පද්ධතියට අනුව උක්ත (i)හි සඳහන් පරිදි වංචනිකව ලියාපදිංචි කර ඇති වාහනවලට අදාළව වලංගු රේගු සටහන්කරයක් නිකුත් වී නොතිබීම හේතුවෙන් එකී සුඛෝපභෝගී වාහන නීත්‍යානුකූල නොවන ලෙස ආනයනය කර ඇති බව හා රේගු පනත ප්‍රකාරය ගෙවිය යුතු ආනයන තීරු බදු කිසිවක් ගෙවා නොමැති බව නිරීක්ෂණය විය.

(iii) උක්ත (i) හි පරිදි ලියාපදිංචි සහතික නිකුත් කර ඇති වාහන වල වැසි අංකයට ආසන්න වෙනත් වැසි අංක සහිත වාහන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචියට අදාල තොරතුරු පරීක්ෂාවේදී එකී වාහන වල නිෂ්පාදන වර්ෂය හා ලියාපදිංචි වී ඇති දිනයන් සැලකිල්ලට ගත් කල මෙම වාහන සම්බන්ධයෙන් ව්‍යාජ දත්ත ඇතුලත් බව නිරීක්ෂණය විය.

(iv) මෙම වංචනික ලියාපදිංචිය සිදුවූ දිනයන් සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු (DMT) දත්ත පද්ධතිය මගින් තහවුරු කරගත නොහැකිවීම හේතුවෙන් මෙම දත්ත ඉලෙක්ට්‍රොනික් ආදායම් බලපත්‍ර (ERL) දත්ත

පද්ධතිය වෙත සම්ප්‍රේෂණය වූ දිනයන් පරීක්ෂා කල අතර දත්ත සම්ප්‍රේෂණය වූ දිනය හා DMT දත්ත පද්ධතිය යාවත්කාලීන වූ දිනයන් සැලකිල්ලට ගත් විට DMT පරිශීලකයින් වංචනිකව දත්ත පද්ධතිය වෙනස් කිරීමට දායක වී ඇති බව නිරීක්ෂණය විය.

(v) මෙලෙස නීත්‍යානුකූල නොවන ආකාරයට මෙරටට ආනයනය කරන ලද හෝ මෙරට එකලස් කරන ලද වාහන, වංචනිකව මෝටර් රථ දෙපාර්තමේන්තුව තුළ ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම හේතුවෙන් දළ වශයෙන් සුඛෝපභෝගී බදු හා අනෙකුත් අයකිරීම් හැර ශ්‍රී ලංකා රේගුව විසින් අයකර ගත යුතුව තිබූ රු.122,282,900ක බදු ආදායමක් වංචනිකව අවභාවිතා කර ඇති බව නිරීක්ෂණය විය.

(ග) භාවිතයට නොගත් හිස් අංක සඳහා වංචනිකව මෝටර් රථ ලියාපදිංචි කිරීමේ සහනික නිකුත්කර තිබූ අවස්ථා

(i) පූර්ව ලියාපදිංචියක් සිදු වී නොමැති ලියාපදිංචි අංක 06ක් සඳහා වංචනිකව ආනයනය කරන ලද හෝ එකලස් කරන ලද වාහනවල එන්ජින් අංක හා චැසි අංක වංචනිකව ඇතුළත් කර ආදායම් බලපත්‍ර නිකුත් කරන ERL දත්ත පද්ධතිය අනුව පෙර වර්ෂයන් හි දී ආදායම් බලපත්‍ර නිකුත් වී නොතිබූ හා පරිගණකගත දත්ත පද්ධතිය අනුව ආසන්නතම ලියාපදිංචි අංක ලියාපදිංචි වී ඇති දිනයන් හා සැලකිල්ලට ගෙන වලංගු මෝටර් රථ ලියාපදිංචි සහතිකයක් නිකුත් කිරීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරීන් කටයුතු කර තිබුණි.

(ii) මෝටර් රථයක් ලියාපදිංචි වී නොතිබූ පැරණි හිස් අංකයක් වන 253-3462 දරන අංකය යටතේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු හම්බන්තොට උපකාර්යාලය මඟින් 2021 ඔක්තෝබර් 24 දින ඉදිරිපත් කර තිබූ අංක TH202129737 දරන පළමු සන්තකය පැවරීමේ අයදුම්පත්‍රය හා අංක TH202129738 දින පරම අයිතිය ලියාපදිංචි කිරීමේ අයදුම්පත් 02ක් භාවිතයෙන් අනීතික ලෙස ආනයනය කරන ලද හෝ එකලස් කරන ලද වාහනයක් සඳහා 2021 දෙසැම්බර් 03 දින වංචනිකව නීත්‍යානුකූල මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කර තිබුණි.

(iii) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතියට වංචනික ලෙස නොරතුරු ඇතුළත් කර ඇති දිනය 2021 දෙසැම්බර් 03 වන දින වුවත්, වංචනික ලියාපදිංචියට අදාළ ලියාපදිංචි අංකයට පෙර ලියාපදිංචි අංකය හා පසු ලියාපදිංචි අංකය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ලියාපදිංචි කළ දිනය හා එකී වාහන නිෂ්පාදනය කළ වර්ෂයට ගැලපෙන සේ උක්ත වංචනික ලියාපදිංචි අංකය වන 253-3462 දරන අංකය මුල් ලියාපදිංචි දින 2000 අගෝස්තු 17 දිනය හා මෝටර් රථයේ නිෂ්පාදන වර්ෂය 1997 වර්ෂය ලෙස පරිගණක පද්ධතියට ව්‍යාජ තොරතුරු ඇතුළත් කර තිබුණි.

(iv) මෝටර් වාහන පනතේ 30(1) ඊ (III) වගන්තිය ප්‍රකාරව මෝටර් වාහනයක් ප්‍රථම ලියාපදිංචිය සිදුකළ දින සිට දින 03ක් ඇතුළත ආදායම බලපත්‍ර ලබාගත යුතු වේ. එහෙත් මෙම වංචනික ලියාපදිංචි කර ඇති වාහනයේ ප්‍රථම ලියාපදිංචි දිනය ලෙස පරිගණක දත්ත පද්ධතිය තුළ වංචනිකව ඇතුළත් කළ 2000 අගෝස්තු 17 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා හිඟ ආදායම් බලපත්‍ර ගාස්තු හා දඩ මුදල් ලෙස රු.195,865ක මුදලක් 2021 දෙසැම්බර් 31 දින ගෙවා එකවර ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, මෙම අංකය යටතේ 2022 වර්ෂය දක්වා මෝටර් වාහනයක් ලියාපදිංචි වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(v) මෝටර් වාහන පනතේ 14 (1) (ඇ) වගන්තිය අනුව වාහන ලියාපදිංචි සහතිකයක කිසියම් වෙනසක් සිදුකිරීමට අයදුම්පතක් ඉදිරිපත් කරන අවස්ථාව වන විට වලංගු ආදායම් බලපත්‍රයක් ඉදිරිපත් කළ යුතු වේ. එහෙත් 2022 දෙසැම්බර් 03 දින පරම අයිතිය ලියාපදිංචි කිරීම හා සන්තකය පැවරීම සිදු වන අවස්ථාවේ දී වලංගු ආදායම් බලපත්‍රයක් ඉදිරිපත් කර නොතිබුණි.

(vi) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතියට අනුව මෙම අනීතික ලියාපදිංචිය තුළ පළමු හිමිකරු බස්නාහිර පළාතේ පුද්ගලයෙකු ලෙස දත්ත ඇතුළත් කර ඇති අතර දෙවන හිමිකරු වයඹ පළාතින් පුද්ගලයෙකු ලෙස දත්ත ඇතුළත් කර ඇත. එහෙත් මෙම පළාත් 02කටම අදාළ නොවන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු හම්බන්තොට ශාඛාව මඟින් මෙම වංචනික ලියාපදිංචිය හා හිමිකම් පැවරීම සිදුකර තිබීම හේතුවෙන් හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන් හිතාමතා වංචනිකව මෙම නීත්‍යානුකූල නොවන ලියාපදිංචිය හා පැවරීම සිදුකර ඇති බව නිරීක්ෂණය විය.

(vii) වලංගු රේගු සටහන්කරයක් නොමැතිව ආනයනය කරන ලද හෝ නීති විරෝධීව එකලස් කරන ලද උක්ත ද්විත්ව කාර්ය වාහනය සඳහා වංචනික ලෙස මෝටර් රථ ලියාපදිංචි සහතිකයක් නිකුත් කිරීම හේතුවෙන් එකී වාහනය වෙනුවෙන් අයකළ යුතුව තිබූ ආසන්න වශයෙන් රු.6,000,000ක නිෂ්පාදන බදු ආදායමක්, රු.181,500ක සුඛෝපභෝගී බදු ආදායමක් හා රු.23,800ක මෝටර් රථ ලියාපදිංචි ගාස්තු ආදායමක් ඇතුළුව එකතුව රු.6,205,300ක බදු ආදායමක් අයකරගැනීමේ අවස්ථාව අහිමි කර තිබුණි.

(viii) 253 – 3460 සිට 253-3465 දක්වා මෝටර් රථ ලියාපදිංචි මුල් ලිපිගොනු පරීක්ෂා කිරීමේ දී 253-3462 අංකය හැර 253-3460 සිට 253-3465 දක්වා ලියාපදිංචි අංක සඳහා සමගාමී අනු අංක සහිත ලියාපදිංචි සහතික නිකුත් වී තිබීම හේතුවෙන් 253-3462 අංක පූර්ව ලියාපදිංචියක් සහිත අංකයක් නොවීම හා පැවරුම සඳහා ඉදිරිපත් කර ඇති ලියාපදිංචි සහතිකයේ අංකය එම කාණ්ඩයේ ලියාපදිංචි සහතිකයන් හි අංක සමඟ

නොගැලපීම මෙන්ම එම ලියාපදිංචි සහතිකයේ කොමසාරිස්තුමාගේ අත්සන හා රබර් මුද්‍රාව ව්‍යාජ ඒවා බව නිරීක්ෂණය වීම හේතුවෙන් පැවරුම් සඳහා ඉදිරිපත් කර ඇති මෝටර් රථ ලියාපදිංචි සහතිකය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ වලංගු ලියාපදිංචි සහතිකයක් නොවන ව්‍යාජව පිළියෙල කරන ලද මෝටර් රථ ලියාපදිංචි සහතිකයක් බව නිරීක්ෂණය වීම.

(ix) ඉහත පැවරුම් සඳහා ඉදිරිපත් කරන ලද මෝටර් රථ ලියාපදිංචි සහතිකයේ හිමිකරු හා පැවරුම්කරු ලෙස හැඳුනුම්තේ පිටපතක් සහිතව නම් සඳහන් කර ඇති පුද්ගලයා එකම පුද්ගලයෙකු නොවීම හා ඉදිරිපත් කර ඇති ජාතික හැඳුනුම්පත පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති වලංගු හැඳුනුම්පතක් නොවන ව්‍යාජ හැඳුනුම්පතක් බව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විගණනය වෙත තහවුරු කර තිබීම.

(x) පැවරුම් සඳහා ඉදිරිපත් කර ඇති ආදායම් බලපත්‍රය පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නීත්‍යානුකූල වලංගු ආදායම් බලපත්‍රයක් නොවන බව පළාත් මෝටර් රථ කොමසාරිස් විගණනය වෙත තහවුරු කර තිබීම.

(xi) පැවරුම් සඳහා ඉදිරිපත් කර ඇති ආකෘති පත්‍රය එකම පුද්ගලයෙකුගේ අත් අකුරින් සම්පූර්ණ කර එකී පුද්ගලයා විසින් පැවරුම්කරු හා පැවරුම්ලාභියා යන පුද්ගලයින් දෙදෙනාගේම අත්සන් යොදා ඇති බව නිරීක්ෂණය වීම.

(xii) එක් දින පැවරුමක දී ලබාගන්නා සියළුම ලේඛණ සත්‍ය පිටපත් බව මාණ්ඩලික නිලධාරියෙකු හෝ සුදුසුකම් සහිත නිලධාරියෙකු විසින් සහතික කරවා ගත යුතු නමුත්, උක්ත ව්‍යාජ බව නිරීක්ෂණය වන පැවරුම්කරුගේ හැඳුනුම්පතෙ හි පිටපත, මෝටර් රථ ලියාපදිංචි සහතිකයේ පිටපත, මෝටර් රථ ලියාපදිංචි සහතිකයේ පිටපත සහ ආදායම් බලපත්‍රයේ පිටපත සත්‍ය පිටපත් බව මාණ්ඩලික නිලධාරියෙකු හෝ සුදුසුකම් සහිත නිලධාරියෙකු විසින් සහතික කරවා ගෙන නොතිබීම.

(xiii) GC-9661 දරන ලියාපදිංචි අංක සහිත වාහනය ද, උක්ත 253-3462හි සඳහන් පැවරුම්කරුගෙන් එහි සඳහන් පැවරුම්ලාභියා වෙතම සන්තකය මාරු කර ඇත. එබැවින් මෙම පැවරුම ද නීත්‍යානුකූල ලිපිලේඛන සහිත පැවරුමක් නොවන බව නිරීක්ෂණය වන අතර, මෙම පැවරුමට අදාළ පැවරුම් ලිපිගොනුව, ලිපිගොනු ගබඩාවෙන් අස්ථානගත වී ඇති බව විගණනය සිදු කළ පරීක්ෂාවේ දී තහවුරු විය.

(ඛ) වාහන අනීතිකව ලියාපදිංචි වීම හා මෝටර් වාහන ලියාපදිංචි කිරීම සඳහා ව්‍යාජ හා කූට ලේඛන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත වසර ගණනාවක සිට විගණන වාර්තා යොමු කර ඇති අතර 2022 වර්ෂයේදී ද අවස්ථා 4ක දී ව්‍යාජ ලියාපදිංචි කිරීම් හා කූට ලේඛන ඉදිරිපත් කිරීම් සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණ

ඉදිරිපත් කර තිබුණි. එහෙත් එකීවාහන පැවරුම්ලාභී ව්‍යාජ හා කූට ලේඛන යොමු කල පාර්ශවයන්ට එරෙහිව කිසිදු නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4. පද්ධති හා පාලන

(අ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන ලියාපදිංචිය හා ඊට අනුශාංගික කරුණු සඳහා රාජකාරී ඉටුකිරීමට අවශ්‍ය පරිගණක දත්ත ඇතුළත් කිරීමට අවසර ඇති පරිශීලකයින්ට පරිගණක මුරපද ලබා දී තිබූ අතර දෙපාර්තමේන්තුවෙන් වෙනත් කාර්යාලවලට ස්ථාන මාරු වී ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ට නිකුත් කර තිබූ මුරපද මෙන්ම, දෙපාර්තමේන්තුවේ සේවය කරන නමුත් රාජකාරී පැවරීම් අනුව භාවිත නොවන මුරපද තවමත් සක්‍රීයව හා ක්‍රියාකාරී තත්ත්වයේ පැවතීම හේතුවෙන් එකී මුරපද භාවිතයෙන් වංචා හා දූෂණ අක්‍රමිකතාවයක් සිදුකිරීමට අවස්ථාව හිමි වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ආදායම් බලපත්‍ර වසර 03කට වැඩි කාලයක් ලබාගෙන නොමැති මෝටර් වාහන නැවත ආදායම් බලපත්‍ර ඉල්ලුම් කිරීමේ දී නියෝජ්‍ය කොමසාරිස් විමර්ෂණගේ නිර්දේශ ලබාගත යුතු බවට කොන්දේසී පනවා ඇතත්, එකී අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමෙන් පමණක් ආදායම් බලපත්‍ර නිකුත් කරන බව සහතික කර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් හඳුන්වා දී නොතිබුණි.

(ඇ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් අවලංගු කරන ලද හෝ නිෂ්ක්‍රීය කරන ලද වාහන ලියාපදිංචි අංක නැවත භාවිතයට ගත නොහැකි පරිදි පරිගණකගත තොරතුරු පද්ධතිය මඟින් අවහිර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරීන් වන කොමසාරිස්වරුන් වෙත ලබා දී ඇති මුරපදයක් භාවිතයෙන් පූර්ව ලියාපදිංචි වාහනයක වැසි අංක ඇතුළු දත්ත පද්ධතිය තුළ ඇති ඕනෑම තොරතුරක් වෙනස් කිරීමට හා මකා දැමීමට අවස්ථාව ලබා දී ඇති අතර එලෙස වෙනස් කරනු ලබන අතීත දත්ත කිසිවක් නැවත ලබාගත නොහැකි ලෙස පද්ධතිය තුළ පූර්ණ වශයෙන් මැකී යාමට අවස්ථාව සලසා දී තිබුණි.

ඊ.එම්.කේ.එම්.පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට

ඊ.එම්.කේ.එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය